# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** කාලය - පැය 02 යි.

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**II පත්‍රය -** කාලය - පැය 03 යි.

මෙම ප්‍රශ්නපත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

**I කොටස** - ව්‍යුහගත ප්‍රශ්න තුනකි. ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් පහකි. එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**II කොටස** - රචනා වර්ගයේ ප්‍රශ්න පහකි. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් හතරකි. එක් කොටසකට ලකුණු 05 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

**අවසාන ලකුණු ගණනය කිරීම** :

| | | |
|---|---|---|
| **I පත්‍රය** | = | 100 |
| **II පත්‍රය** | = | 100 |
| **අවසාන ලකුණ** | = | 200 ÷ 2 = 100 |

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

45 S I

2018.08.06 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන උත්තරය තෝරාගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

1. බ්‍රාහ්මණ වර්ණය හැඳින්වීමට 'ද්විජ' යන යෙදුම තද් සංස්කෘතිය තුළ ව්‍යවහාර වුණි. බ්‍රාහ්මණයන් දෙවරක් උපන් පූජනීය පිරිසක් ලෙස සමාජයේ ඉහළින් වැජඹීමට මෙම ද්විජ සංකල්පය උපයෝගි කර ගත් බව පෙනේ. බ්‍රාහ්මණ පිළිගැනීමට අනුව පළමුවරට මහා බ්‍රහ්මයාගේ මුවින් උපන් බමුණන් දෙවෙනි වරට උපත ලබන්නේ,
   (1) ජාත කර්මයෙනි.
   (2) නාම කර්මයෙනි.
   (3) චූඩා කර්මයෙනි.
   (4) උපනයන කර්මයෙනි.
   (5) යාග කර්මයෙනි.

2. බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායට අයත් බොහෝ දාර්ශනික සංකල්ප හා ආගමික ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ ඇතැම් ශ්‍රමණයන් විසින් පිළිපදින ලද ඇවතුම් පැවතුම් හා සිරිත් විරිත්වලට අනුගත වූ බව දක්නට ලැබේ. එසේ වුවත් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට අනන්‍ය වූ චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකිව ඇත්තේ,
   (1) වස් විසීමයි.
   (2) පිණ්ඩපාතයයි.
   (3) අනගාරික ජීවිතයයි.
   (4) උපොසථයයි.
   (5) උපසම්පදාවයි.

3. "ණය වී හෝ කා බී සැප විඳිය යුතුය, මරණය යනු මෝක්ෂයයි. මරණයෙන් පසු සත්ත්වයාගේ පැවැත්මක් නැත." යනු සුඛ පරමවාදී දෘෂ්ටිවාදයකි. මෙම දර්ශනවාදයට වඩාත් සමීප ආගමික ඉගැන්වීමක් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,
   (1) අජිත කේශකම්බල ය.
   (2) පකුධ කච්චායන ය.
   (3) පූරණ කස්සප ය.
   (4) මක්ඛලී ගෝසාල ය.
   (5) නිගණ්ඨනාතපුත්ත ය.

4. වෛදික යුගයේ සිටම භාරතීය චින්තකයන් විසින් සත්ත්වයා හා ලෝකය පිළිබඳ ගැඹුරින් ගවේෂණය කරනු ලැබී ය. ශ්‍රමණ සම්ප්‍රදායයේ ප්‍රභවයත් සමග මෙම තත්ත්වය වඩාත් තීව්‍ර වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ දර්ශනවාද හඳුන්වාදීමට පෙළඹුණහ. මෙහිදී ශ්‍රමණ දාර්ශනිකයන් විසින් හඳුන්වා දෙන ලද දර්ශනවාදයක් ලෙස **නොසැලකිය** හැක්කේ,
   (1) ශාස්වතවාදයයි.
   (2) උච්ඡේදවාදයයි.
   (3) ඊශ්වර නිර්මාණවාදයයි.
   (4) නියතිවාදයයි.
   (5) අකිරියවාදයයි.

5. බුද්ධ කාලීන භාරතයේ ක්‍රියාත්මක වූ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) "කාන්තාව දැඩි පීඩනයකට යටත් කොට තිබූ අතර සති පූජාව අනිවාර්ය විය." යන්නයි.
   (2) "භක්තිය පදනම් කරගත් කර්ම මාර්ගය බ්‍රහ්ම සහව්‍යතාව පිණිස එකම පිළිවෙත විය." යන්නයි.
   (3) "වේද ග්‍රන්ථ දේව භාෂිත සේ පිළිගත් අතර කර්ම විපාක ප්‍රතික්ෂේප කරන ලදී." යන්නයි.
   (4) "චතුර්වර්ණය අනුව සිදු කරන ලද සමාජ වර්ගීකරණය පිළිගත් අතර පුද්ගලයා විසින් සිදු කරනු ලබන කර්මය අනුව කෙනෙකුගේ උසස් පහත් බව තීරණය වේ." යන්නයි.
   (5) "ස්වධර්ම පිළිගත් අතර, බ්‍රාහ්මණ සහ ක්ෂත්‍රිය වර්ණ දෙකට අනෙක් වර්ණවලට අයත් ඕනෑම කටයුත්තක් කළ හැකිය." යන්නයි.

6. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පුද්ගලයාගේ ශක්තිය හා ස්වාධීනත්වය සනාථ කිරීමෙහි ලා වඩාත් ගැළපෙන බෞද්ධ ප්‍රකාශය ලෙස හඳුනාගත හැක්කේ,
   (1) "තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නො කළ යුතුය." යන්නයි.
   (2) "සියලු සත්ත්වයෝ දඬුවමට බිය ය." යන්නයි.
   (3) "තමාට පිහිට තමාම මිස අන් අයගේ පිහිටක් කොයින් ද?" යන්නයි.
   (4) "නීරෝගී බව පරම ලාභය වේ." යන්නයි.
   (5) "පින් කරන සිල්වත් ගිහියාට ශක්‍රයා ද නමස්කාර කරයි." යන්නයි.

7. රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කරන දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීම්වලින් ගම්‍ය **නොවන** ප්‍රකාශය ලෙස සැලකිය හැක්කේ,
   (1) "බදු ගෙවීම ජනතාවගේ යුතුකමකි." යන්නයි.
   (2) "පාලකයා වෙත ඇති බලය ජනතාව විසින් පවරාදෙන ලද්දකි." යන්නයි.
   (3) "වැරදිකරුවන්ට දඬුවම්දීම පාලකයාගේ වගකීමකි." යන්නයි.
   (4) "ජනතාවගේ බදු ලබාගැනීම සඳහා රජුට බලයක් ඇත." යන්නයි.
   (5) "රජුට අනුශාසනා කිරීම බ්‍රාහ්මණ වර්ණයේ වගකීමකි." යන්නයි.

8. පහත ප්‍රකාශ අතුරෙන් දශරාජ ධර්මවලට අයත් **නොවන** කරුණක් ඇතුළත් ප්‍රකාශය කුමක් ද?
   (1) දානය, ශීලය, ප්‍රඥාව, මෘදු බව, ඍජු බව
   (2) ක්ෂාන්තිය, අවිහිංසාව, අක්‍රෝධය, තපෝගුණය, පරිත්‍යාගය
   (3) දානය, තපෝගුණය, අක්‍රෝධය, අවිහිංසාව, පරිත්‍යාගය
   (4) තපෝගුණය, ශීලය, ක්ෂාන්තිය, අවිරෝධතාව, අක්‍රෝධය
   (5) අක්‍රෝධය, අවිහිංසාව, පරිත්‍යාගය, අවිරෝධතාව, දානය

9. දස සක්විතිවත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතට ඇතුළත් **නොවන්නේ,**
   (1) "අන්තඃපුර ජනයා කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
   (2) "බල සේනාව කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
   (3) "බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
   (4) "විවාහක අවිවාහක ස්ත්‍රීන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
   (5) "ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.

10. සිගාලෝවාද සූත්‍රයට අනුව උතුරු දිශාවෙන් නියෝජනය වන්නේ,
   (1) ආචාර්යවරුන් ය.	(2) අඹු සැමියන් ය.	(3) [illegible]ුරන් ය.
   (4) සේවකයන් ය.	(5) මහණ බමුණන් ය.

11. රිය සකට කඩ ඇණය මෙන් සමාජ ප්‍රගමනය සඳහා හේතු ව[illegible]ම කරුණු හතරක් සිගාලෝවාද සූත්‍රාගත සමාජ ආචාරධර්ම තුළ අන්තර්ගත වේ. එම කරුණු ඇතුළත් [illegible]පර්යාය හඳුන්වන්නේ,
   (1) සතර සංග්‍රහ වස්තු නමිනි.	(2) [illegible]තර බ්‍රහ්ම විහරණ නමිනි.
   (3) සතර කර්ම ක්ලේශ නමිනි.	(4) සතර මහාපදේස නමිනි.
   (5) සතර අගති නමිනි.

12. අපරාධ බහුලවීම සමාජයක් භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් පරිහානියට පත්වීමට බලපාන ප්‍රධාන සාධකයකි. සමාජය තුළ අපරාධ ඇතිවීම ආකස්මික වූවක් නොව, විවිධ හේතු කරණ කොටගෙන පටිච්චසමුප්පන්නව සිදුවන බව කූටදන්තාදී සූත්‍රවලින් පැහැදිලි වේ. මෙම අපරාධ මර්දනය කිරීම රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගත්තා බුදුසමය දස සක්විතිවත්වලින් ද ඒ බව පෙන්වා දී ඇත. අපරාධ සම්භවය හා ව්‍යාප්තිය විග්‍රහ කරන බෞද්ධ න්‍යායට අනුව අපරාධ මර්දනය සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය ලෙස හඳුනාගත හැක්කේ,
   (1) නීතිගරුකවීමේ වැදගත්කම පහදාදීමයි.	(2) මිනිසා වරදට පොළඹවන හේතු නැති කිරීමයි.
   (3) ආරක්ෂක විධිවිධාන තර කිරීමයි.	(4) වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමයි.
   (5) වරදට සමාව දී වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීමයි.

13. පුද්ගලයා විසින්ම සිදු කරනු ලබන විවිධ ලාමක ක්‍රියා කරණකොටගෙන ඔහු ආර්ථික පරිහානියට පත්වන ආකාරය බුදුසමය පෙන්වා දෙයි. සිගාලෝවාද සූත්‍රයෙහි 'භෝගයන්ගේ අපායමුඛ' යනුවෙන් දක්වා ඇත්තේ ද එවැනි කරුණු සයකි. එම ෂඩ්විධ භෝග විනාශ මුඛවලට අයත් **නොවන** කරුණක් වන්නේ,
   (1) සුරාවයි.	(2) සූදුවයි.	(3) පාපමිත්‍රසේවනයයි.
   (4) ස්ත්‍රී ධූර්තවීමයි.	(5) අලසකමයි.

14. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, නව යොවුන් තරුණ වියෙහි සිටි මම නව යොවුන් තරුණ වියෙහි සිටි නකුල මාතාව පතිකුලයට ගෙන ආවෙමි. එතැන් පටන් මම සිතින් හෝ වෙනත් ස්ත්‍රියක් නො පැතුවෙමි. ඉදින් ඇය ඉක්මවා වෙනත් කතක් වෙත ගියේ යයි කියනු කුමට ද? භාග්‍යවතුන් වහන්ස, අප දෙදෙනා මෙලොවෙහි පමණක් නොව පරලොව දී පවා ඔවුනොවුන් දකිනු රිසියෙමි." යි නකුල පිතු විසින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරන ලදුව, නකුල මාතාව විසින් ද එවැනිම ප්‍රකාශයක් කරන ලදී. ඉහත ඡේදයට අනුව නකුල මාතාව හා නකුල පිතු යන දෙදෙනා,

(1) සිත කය දෙකෙන් අකුසල්වල යෙදී නැත.
(2) දස අකුසල්වලින් වෙන් ව කටයුතු කොට ඇත.
(3) පන්සිල් කඩ නොකොට ආරක්ෂා කොට ඇත.
(4) ස්ත්‍රී පුරුෂයන් කාම හේතුවෙන් අකුසල් කිරීම හෙලා දැක ඇත.
(5) මිථ්‍යාකාමයෙන් වෙන් ව කටයුතු කොට ඇත.

15. දැඩි ලෝභය වනාහී නිර්වාණගාමී මාර්ගය අවුරාලන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගන්නා බෞද්ධයා, අනුන්ගේ වස්තුව කෙරෙහි ලෝභ සිත නූපදවමින් හැකි සෑමවිටම ලාභාපේක්ෂාවෙන් තොරව සිය ධනය දානාදී කටයුතු සඳහා යෙදවීමටත්, පරිත්‍යාගශීලීව කටයුතු කිරීමටත් පෙළඹේ. එසේම ක්‍රෝධය, වෛරය, ආඝාතය, පළිගැනීම ආදී ව්‍යාපාද නාමයෙන් හඳුන්වන තරහ සිතුවිලි උපදවාගැනීම තමාටම බොහෝ අහිත පිණිස, දුක් පිණිස හේතු වන බව දන්නා හෙතෙම ඉවසීමෙන් හා මෛත්‍රියෙන් කටයුතු කිරීමට උත්සාහ දරයි. මිථ්‍යා ඇදහිලි, විශ්වාස හා විවිධ වැරදි දෘෂ්ටීන්හි එල්බ ගැනීමෙන් මංමුලා නො වන ඔහු මෙලොව හා පරලොව ජයගෙන නිවන් සාක්ෂාත් කිරීම තම ඒකායන අරමුණ ලෙස සලකා නිවැරදි දැක්මෙන් යුතුව යථාර්ථවාදී ජීවිතයක් ගත කරයි.
ඉහත ඡේදයෙන් ගම්‍ය වන බෞද්ධ සදාචාර මාර්ගයට බාධා පමුණුවන අකුසල් ඇතුළත් ඉගැන්වීම හඳුන්වනු ලබන්නේ,

(1) පඤ්ච නීවරණ නමිනි.
(2) දශ අකුසල් නමිනි.
(3) ත්‍රිවිධ අකුසල මූලයන් නමිනි.
(4) සතර කර්මක්ලේශ නමිනි.
(5) දශ වස්තුක මිථ්‍යාදෘෂ්ටි නමිනි.

16. 'සුබෝධ' කනිෂ්ඨ විද්‍යාලයීය ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් පවත්වන ලද සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය පිණිස මහසඟරුවන වඩමවන ලද්දේ විද්‍යාලයීය තූර්යවාදක කණ්ඩායම විසින් පවත්වන ලද ගරු බුහුමන් හා හරසර මධ්‍යයේ ය. පා ධෝවනය, දැහැත් ගිලන්පස පිළිගැන්වීම ආදී සියලු වතාවත් පාසල් දරු දැරියන් විසින්ම සිදු කරන ලද අතර විදුහල්පතිතුමා විසින් දැහැත් වට්ටියක් පිරිනමා පිරිත් දේශනය පිණිස මහාසංඝරත්නයට ආරාධනා කරන ලදී. පඤ්චශීල සමාදානයෙන් අනතුරුව පිරිතෙහි අනුසස් පිළිබඳ විවිනා අනුශාසනයක් පවත්වනු ලද අතර, කර්මඵල විශ්වාස කිරීමේ නුවණින් සැදැහැ සිත් පෙරදැරි ව සියලු දෙනා අනුශාසනය ද අනතුරුව පිරිත් ධර්මය ද ශ්‍රවණය කළහ. පසුදින මහාසංඝරත්නය විෂයයෙහි සැදැහැ සිතින් හීල් දානය පිරිනැමීමෙන් අනතුරුව පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කොට මියපරලොව ගිය ආදිකර්තෘන් ඇතුළු සියලු දෙනාට පැන් වඩා පිං පැමිණ වූ විදුහල්පතිතුමා ප්‍රමුඛ පිරිස තම තමන්ද පිං අනුමෝදන් ව පිංකම හමාර කළහ. ඉහත පිංකම් මාලාව තුළ දී බුදුසමයේ ඉගැන්වෙන දශ පුණ්‍යක්‍රියා අතරින් පාසල් සිසු දරු දැරියන්ට සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ පුණ්‍යක්‍රියාව ලෙස හඳුනාගත හැක්කේ,

(1) භාවනාවයි.
(2) පත්තිදානයයි.
(3) පත්තානුමෝදනාවයි.
(4) ශීලයයි.
(5) දෘෂ්ටිය ඍජු කරගැනීමයි.

17. 'ආධිපතෙය්‍යධම්ම' යනුවෙන් හැඳින්වෙන්නේ අධිපති ධර්මයයි. බුදුසමයෙහි අධිපති ධර්මවල උපයෝගීතාව අවධාරණය කොට ඇත්තේ,

(1) පින් පව්වල ප්‍රබලත්වය හා දුබලබව හඳුනාගැනීම පිණිස ය.
(2) ආරාම පාලකයෙහිලා ප්‍රධානත්වය හඳුනාගැනීම පිණිස ය.
(3) ධර්මයේ හරි වැරදි විනිශ්චය කරගැනීම පිණිස ය.
(4) කුසල් අකුසල් විනිශ්චය කරගැනීම පිණිස ය.
(5) විනය නීතිවල උචිත අනුචිත බව තහවුරු කරගැනීම පිණිස ය.

18. ආකාරවතී ශ්‍රද්ධාවේ විශේෂ ලක්ෂණයකි,

(1) වහා පැහැදී තෙරුවන් ඇදහීම.
(2) ඉල්පෙන පොපියන පැහැදීමෙන් තෙරුවන් ඇදහීම.
(3) භක්තියෙන් තෙරුවන් ඇදහීම.
(4) නිරාමිස ප්‍රීතියෙන් තෙරුවන් ඇදහීම.
(5) විමසා බලා විචාර පූර්වක ව තෙරුවන් ඇදහීම.

19. බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්මදූත කණ්ඩායම පිටත් කරමින් "චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං, මා එකෙන ද්වෙ අගමිත්ථ" යනාදී වශයෙන් දේශනා කරන ලද ප්‍රකට උපදේශය මහාවග්ග පාලියේ සඳහන් වේ. මෙම ප්‍රකාශය තුළ කළමනාකරණය පිළිබඳ මූලික බෞද්ධ ඉගැන්වීමක් අන්තර්ගත වේ. ඒ අනුව මෙම ප්‍රකාශය තුළින් ප්‍රකට වන්නේ,
(1) කාල කළමනාකරණයයි.
(2) පිරිස් කළමනාකරණයයි.
(3) ආධ්‍යාත්මික කළමනාකරණයයි.
(4) භෞතික සම්පත් කළමනාකරණයයි.
(5) පරිසර කළමනාකරණයයි.

20. ගෘහස්ත ජීවිතයේ ආර්ථික සමෘද්ධිය පිණිස බුදුසමයෙන් අනුමත දැහැමි ජීවනෝපායයක් ලෙස වෙළඳාම හෙවත් ව්‍යාපාරික කටයුතු දැක්විය හැකිය. ඒ අතර නො කටයුතු වෙළඳාම් පිළිබඳව ද බුදුසමය අවධාරණය කරයි. එවැනි නොකටයුතු වෙළඳාම් පහක් වණිජ්ජා සූත්‍රයෙහි පැහැදිලි ව පෙන්වා දී ඇති අතර එහි දැක්වෙන 'සත්ථවණිජ්ජා හා සත්තවණිජ්ජා' යනුවෙන් දැක්වෙන්නේ,
(1) අවිආයුධ වෙළඳාම හා සතුන් වෙළඳාමයි.
(2) මස් වෙළඳාම හා සතුන් වෙළඳාමයි.
(3) අවිආයුධ වෙළඳාම හා මස් වෙළඳාමයි.
(4) සතුන් වෙළඳාම හා මත්ද්‍රව්‍ය වෙළඳාමයි.
(5) අවිආයුධ වෙළඳාම හා වසවිස වෙළඳාමයි.

21. බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලා ද ස්වභාව සෞන්දර්යය හා නිර්මාණාත්මක සෞන්දර්යය අගය කළ අවස්ථා ත්‍රිපිටක සාහිත්‍යයෙහි ඇතුළත් වේ. එසේවුව ද "නච්චගීතවාදිත විසූකදස්සන මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩණ විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි" යන ශික්ෂා පදයෙන් සරාගී සෞන්දර්ය රසාස්වාදය නොකළයුතු බව ශීලය පිළිබඳ බුදුසමයාගත ඉගැන්වීම්වලින් පැහැදිලි වේ. මෙම ශික්ෂා පදයෙන් සරාගී සෞන්දර්ය රාසාස්වාදය නුසුදුසුබව දේශනා කොට ඇත්තේ,
(1) සිවුවනක් පිරිසටම ය.
(2) උපාසක උපාසිකාවන්ට ය.
(3) පෙහෙවස් සමාදන් වූ පිරිසට ය.
(4) සියලු බෞද්ධයන්ට ය.
(5) භාවනානුයෝගීන්ට ය.

22. බෞද්ධ පැවිදි සමාජයේ ව්‍යාප්තියත් සමග විවිධ අරමුණු සහිත පුද්ගලයෝ බුදුසසුන තුළ පැවිදි වූහ. ලාභ සත්කාර අපේක්ෂාවෙන් සසුන්ගත වූ අන්‍යතීර්ථක පැවිද්දන් ද ඒ අතර විය. මෙසේ සසුන්ගත වූ අන්‍යතීර්ථකයන්ගේ ක්‍රියා කලාපය සැබෑ බෞද්ධ සංඝ සමාජයේ පැවැත්මට හිතකර නො විය. මේ නිසා වෙනත් සසුනක පැවිදිව සිට බුදුසසුනේ පැවිදි උපසම්පදාව අපේක්ෂා කරන අය සිවු මසක පරිවාස කාලයක් ගත කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ විසින් කොන්දේසියක් පනවන ලදී. එහෙත් මෙම පරිවාස කාලය පිළිබඳ නියමයෙන් ශාක්‍ය වංශිකයන් නිදහස් කරන ලද අතර, එයට හේතු වූයේ,
(1) ශාක්‍ය වංශිකයන් වැරදි නො කිරීමයි.
(2) ශාක්‍ය වංශිකයන් සසුන් ගතවීමට දැක් වූ දැඩි කැමැත්තයි.
(3) ශාක්‍ය වංශිකයන් පරිවාස කාලයක් ගත කිරීමට අකමැතිවීමයි.
(4) ශාක්‍ය වංශිකයන්ට විශේෂ වරප්‍රසාදයක් ලබාදීමට බුදුරදුන්ට අවශ්‍යවීමයි.
(5) ශාක්‍ය වංශිකයන් පාලනය කිරීම පහසුවීමයි.

23. බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥාණයට අයත් වන්නේ,
(1) පුබ්බෙනිවාසානුස්සති ඥාණය, පරචිත්තවිජානන ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(2) පුබ්බෙනිවාසානුස්සති ඥාණය, දිබ්බචක්ඛු ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(3) පුබ්බෙනිවාසානුස්සති ඥාණය, දිබ්බසොත ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(4) පුබ්බෙනිවාසානුස්සති ඥාණය, මනෝමයඉද්ධි ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(5) පුබ්බෙනිවාසානුස්සති ඥාණය, දිබ්බචක්ඛු ඥාණය හා දිබ්බසොත ඥාණයයි.

24. ආගමික සහනශීලීතාව බුද්ධ චරිතයෙන් ප්‍රකට වන විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි ය. බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමික පිරිස් සමග ඉතා සුහදව කටයුතු කළ බව සනාථ කරන සාධක ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමුවේ. බුදු සිරිතේ ඇතුළත් මෙම විශේෂ ලක්ෂණය සනාථ කිරීමෙහිලා වඩාත් ම ගැලපෙන සිදුවීම ලෙස හඳුනාගත හැක්කේ,
(1) තුන් බෑ ජටිලයන් පැවිදි කිරීමයි.
(2) සෝණදණ්ඩ බමුණා බුදුරදුන් බැහැ දැකීමට යාමයි.
(3) සංජය පිරිවැජියාගේ අතවැසියන් බුදුසසුනෙහි පැවිදි කිරීමයි.
(4) සකුළුදායී පිරිවැජියාගේ ආරාමයට වැඩම කොට ඔහු හා සාකච්ඡා කිරීමයි.
(5) උපාලි ගෘහපතියාට සිය ආචාර්යවරයා වූ නිගණ්ඨනාතපුත්ත වෙතට යන ලෙස දැනුම්දීමයි.

**25.** කෙලෙස්වලින් දූෂිත වූ සමාජයක නො කිලිටි ව, නිකෙලෙස් ව ජීවත්වීම බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන උතුම් ගුණයක් ලෙස මූලාශ්‍රයන්හි දැක්වේ. මෙම සුවිශේෂ ලක්ෂණය හැඳින්වීමට වඩාත්ම ගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) "පක්ෂියකු මෙන් සැහැල්ලුවෙන් ජීවත්වීම" යන්නයි.
(2) "කඟවේණකු මෙන් හුදකලාව හැසිරීම" යන්නයි.
(3) "තාදී ගුණයෙන් යුතුව කටයුතු කිරීම" යන්නයි.
(4) "විරාගීචරණය" යන්නයි.
(5) "පද්මාකාර ජීවිතය" යන්නයි.

**26.** "එව මහණ, මාගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවේ හැසිරෙව." යනුවෙන් බුදුරදුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් සම්පූර්ණ වූ පැවිදි උපසම්පදා ක්‍රමය හඳුන්වන්නේ,
(1) පඤ්හව්‍යාකරණ උපසම්පදාව නමිනි.
(2) සරණාගමන උපසම්පදාව නමිනි.
(3) ඒහිභික්ඛු උපසම්පදාව නමිනි.
(4) අට්ඨවාචික උපසම්පදාව නමිනි.
(5) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමිනි.

**27.** 'සත්තාහකරණය' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) භාවනාව පිළිබඳ ධර්මෝපදේශයකි.
(2) පොහොය කර්ම කිරීම පිළිබඳ විධිනියමයකි.
(3) වස් එළඹීම පිළිබඳ විධිනියමයකි.
(4) වස් පවාරණය පිළිබඳ විධිනියමයකි.
(5) වස් විසූ ස්ථානයෙන් බැහැර යාම පිළිබඳ විධිනියමයකි.

**28.** බුදුසසුනෙහි පළමුව තෙරුවන් සරණ ගිය උපාසකයා වූයේ
(1) බරණැස් සිටුතුමා ය.
(2) අනේපිඬු සිටුතුමා ය.
(3) යසකුල පුත්‍රයා ය.
(4) බිම්බිසාර රජතුමා ය.
(5) සෝණිත සිටුතුමා ය.

**29.** එකම දිනක දී සිය සැමියාත්, පුතුන් දෙදෙනාත්, මව සහ පියාත්, සහෝදරයාත් මරණයට පත්වීමෙන් අසරණ වූ පටාචාරාව බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසා නිවී සැනසී ශාසනික තනතුරු පවා ලැබූ බව මූලාශ්‍රයෙහි දැක්වේ. ඒ අනුව පටාචාරාව අගතනතුරට පත්වූයේ,
(1) ධර්මධර භික්ෂුණීන් අතර ය.
(2) ධූතාංගධර භික්ෂුණීන් අතර ය.
(3) විනයධර භික්ෂුණීන් අතර ය.
(4) ධර්මකථික භික්ෂුණීන් අතර ය.
(5) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර ය.

**30.** බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂු භික්ෂුණීන් උදෙසා පනවන ලද කිසිදු විනය ශික්ෂාවක් වෙනස් නොකිරීමටත්, නොපනවන ලද කිසිදු විනය ශික්ෂාවක් නොපැනවීමටත් ප්‍රථම සංගීතිකාරක තෙරවරුන් විසින් තීරණය කරන ලද්දේ,
(1) ආනන්ද තෙරුන් බුදුරදුන්ගෙන් ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද මොනවාදැයි නො විමසා තිබූ හෙයිනි.
(2) මහජනතාවගෙන් එල්ල විය හැකි විරෝධතාව ද සලකා මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ඊට අකමැත්ත ප්‍රකාශ කළ හෙයිනි.
(3) විනය ශාසනයේ ආයුෂ වූ බැවින් විනය නීති වෙනස් කිරීම ශාසනයේ පරිහානියට හේතු වේ යයි සැලකූ හෙයිනි.
(4) වෙනස් කළ යුතු ශික්ෂාපද මොනවා දැයි නිශ්චය කරගත නොහැකි වූ හෙයිනි.
(5) පනවා තිබූ සියලු ශික්ෂාපද භික්ෂු ජීවිතයට අනිවාර්ය යයි සැලකූ හෙයිනි.

**31.** වජ්ජිපුත්තක භික්ෂූන් විසින් කැප යයි පිළිගෙන පිළිපදින ලද දස වස්තුවෙහි දැක්වෙන 'අදසකනිසීදනකප්ප' යනු,
(1) එක් සීමාවක පිහිටි කුඩා කුඩා ආවාසවල වෙන වෙනම සිටිමින් පොහොය කිරීම කැප බව ය.
(2) විමසා බැලීමකින් තොරව පාරම්පරික දේ පිළිගැනීම කැප බව ය.
(3) දාවලු නැති ඇඳ ඇතිරිලි පරිහරණය කැප බව ය.
(4) එක් සීමාවක් තුළ වාසය කරන භික්ෂූන්ගේ කැමැත්ත නොගෙන වෙන් වෙන්ව පොහොය කොට පසුව කැමැත්ත ගැනීම කැප බව ය.
(5) වරක් වළඳා අවසන් කොට තවත් ගමකට ගොස් එහි සිට නැවත වැළඳීම කැප බව ය.

**32.** ධර්මාශෝක රාජ්‍ය සමයේ භික්ෂූන් වහන්සේලා වසර ගණනාවක් පොහොය කර්ම කිරීමෙන් වැළකී සිටි බව මූලාශ්‍රය වාර්තාවල දැක්වේ. එසේ පොහොය කර්ම නොකිරීමට හේතුව ලෙස දැක්වෙන්නේ,
(1) පොහොය සීමා නොමැතිවීමයි.
(2) රාජ්‍යානුග්‍රහය නොලැබීයාමයි.
(3) උපසපන් භික්ෂූන් නො සිටීමයි.
(4) දුස්සීල භික්ෂූන් සුලභවීමයි.
(5) අන්‍යාගමික තර්ජන බහුලවීමයි.

33. පැරණි භාරතීය විශ්වවිද්‍යාලයක කීර්තිමත් ආචාර්යවරයකු වූ ශාන්තරක්ෂිත හිමියන් ප්‍රමුඛ මහායාන පඬිවරයෙකි. උන්වහන්සේ ආචාර්යවරයකු වශයෙන් සේවය කෙළේ,
(1) නාලන්දා විශ්වවිද්‍යාලයේ ය.
(2) වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ය.
(3) ඔදන්තපුරී විශ්වවිද්‍යාලයේ ය.
(4) වලභි විශ්වවිද්‍යාලයේ ය.
(5) ජගද්දලා විශ්වවිද්‍යාලයේ ය.

34. තෙවන ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණයකට අනුව භාරතය තුළ හා භාරතයෙන් පිටත පිහිටි රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත් කර යවන ලදී. මෙම වැඩපිළිවෙළ අනුව මහාදේව හිමියන්ට වැඩම කිරීමට ලැබුණේ,
(1) මහිස මණ්ඩලයටයි.
(2) හිමවන්ත දේශයටයි.
(3) යෝනක දේශයටයි.
(4) වනවාස දේශයටයි.
(5) අපරන්ත දේශයටයි.

35. බුදුසසුන වෙනුවෙන් සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළ කණිෂ්ක රජතුමා ධර්ම සංගායනාවක් සඳහා අනුග්‍රහය දැක්වීමට පෙළඹුණේ,
(1) දුසිල් මහණුන් සසුනින් නෙරපීමට අවශ්‍ය වූ බැවිනි.
(2) සංගායනාවක අවශ්‍යතාව භික්ෂූන් විසින් පෙන්වාදෙන ලද බැවිනි.
(3) අශෝක අධිරාජයා විසින් බුදුසසුනට සිදුකරන ලද මෙහෙයට නොදෙවෙනි මෙහෙයක් සිදු කිරීමට තමන්ට ද අවශ්‍ය වූ බැවිනි.
(4) ගොපලු වෙසින් පැමිණි දෙවියකු විසින් "අනාගතයේ දී කණිෂ්ක නම් රජ කෙනෙකු ධර්ම සංගායනාවක් පවත්වන්නේ ය." යි බුදුරදුන් විසින් දේශනා කොට ඇති බව පවසන ලද බැවිනි.
(5) "සංගායනාවක් පැවැත්වීම බෞද්ධ නරපතියකු විසින් සිදු කළ යුතු අනිවාර්ය කටයුත්තකි." යන සම්මතයක් පැවති බැවිනි.

36. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ප්‍රතිපත්තියට අනුව සිය පාලන තන්ත්‍රය මෙහෙයවීමට උත්සුක වූ සිරිසඟබෝ රජු,
(1) පඤ්චශීල ප්‍රතිපදාව මත කටයුතු කළ ද සොරකම් කරන්නන්ට මරණ දඬුවම පමුණුවන බව ප්‍රසිද්ධ කිරීමට ක්‍රියා කෙළේ ය.
(2) සතර පොහොය දිනවල ගොඩබිම සතුන්ට මෙන්ම ජලජ සතුන්ට ද අභයදානය දීමට කටයුතු කෙළේ ය.
(3) මත්පැන් පානය කරන්නා කිසිදු කටයුත්තකට නොහොබිනේ යයි ප්‍රකාශ කෙළේ ය.
(4) මාඝාත නීතිය පැනෙව්වේ ය.
(5) බොරු නඩු පවරන්නන් සිරගත කෙළේ ය.

37. ලංකා ශාසන ඉතිහාසයේ මහත් ආන්දෝලනයක් ඇති කරමින් නව ප්‍රතිසංස්කරණවාදී අදහස් ඉදිරිපත් කළ ආයතනයක් ලෙස අභයගිරි විහාරය හඳුන්වා දිය හැකි ය. මහායාන බුදුදහම ලක්දිව ප්‍රචලිත කිරීමෙහි ලා පහසුකම් සැපයූ අභයගිරිය, මහා විහාරය සතු ඇතැම් ආයතන හා සම්පත් ද තමන් සතු කරගත් බව ශාසන ඉතිහාසයෙන් තහවුරු වේ. එවැනි එක් අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
(1) මහාකාලසිලා ප්‍රතිමාව තමා සන්තක කර ගැනීමයි.
(2) තොලුවිල ප්‍රතිමාව තමා සන්තක කර ගැනීමයි.
(3) ථූපාරාමය පවරා ගැනීමයි.
(4) වෙස්සගිරිය පවරා ගැනීමයි.
(5) දළදා වහන්සේ තමා සන්තක කර ගැනීමයි.

38. ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලංකාවේ දෙවියන් ඇදහීම යක්ෂ වන්දනය මෙන්ම වෙනත් විවිධ ආගමික විශ්වාස පැවති බව මහාවංසාදී වාර්තාවලින් තහවුරු වේ. නගරයේ බස්නාහිර දොරටුව සමීපයේ නුග ගසක් වෙන්කොට තිබුණේ එසේ වන්දනීයත්වයට පත් එක්තරා දෙවියකු වෙනුවෙනි. මහායාන ඉගැන්වීම් අනුව ද දේවත්වයෙන් පුදනු ලැබූ මොහු,
(1) කම්මාර දෙවියා ය.
(2) ව්‍යාධ දෙවියා ය.
(3) වෛශ්‍රවණ දෙවියා ය.
(4) විභීෂණ දෙවියා ය.
(5) ධෘතරාෂ්ට්‍ර දෙවියා ය.

39. ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය වඩාත් ස්ථාවරත්වයට පත් වූයේ ක්‍රි.ව. 5 වන සියවසේ හෙළ අටුවා ග්‍රන්ථ පාලියට පරිවර්තනය කිරීමට විදෙස් රටවල සිට මෙරටට පැමිණි විද්වත් භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය කරණකොට ගෙන ය. එසේ පැමිණි භික්ෂූන් වහන්සේලා අතර බුද්ධඝෝෂ හිමියන් සුවිශේෂ වේ. බුද්ධඝෝෂ හිමියන්ට සමකාලීන ව භාරතයේ සිට පැමිණි තවත් පරිවර්තක භික්ෂුවක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) සංඝමිත්‍ර හිමියන් ය.
(2) බුද්ධදත්ත හිමියන් ය.
(3) මහාතිස්ස හිමියන් ය.
(4) මහානාම හිමියන් ය.
(5) උපසේන හිමියන් ය.

40. බුරුමයට බුදුසමය හඳුන්වාදීමට පෙර එරට වැසියන්ගේ ප්‍රධාන ආගමික ඇදහීම වූයේ නාත් වන්දනය යි. බුදුදහම හඳුන්වාදීමෙන් අනතුරුව ද බුරුම වැසියන් නාත් වන්දනයෙන් සපුරා නිදහස් නොවූ බවට සාධක පවතියි. බුදුදහම බුරුමයේ රාජ්‍ය ආගම බවට පත් කළ අනවරථ රජතුමා නාත් භූතයන් තිස්හය දෙනාගේ ප්‍රතිමා ස්වේදගොන් දාගැබ වටා ඉදිකිරීම ඊට කදිම නිදසුනක් ලෙස දැක්විය හැකි අතර රජු එම ක්‍රියාදාමයෙන් අපේක්ෂා කෙළේ,
(1) රජු තුළ නාත් භූතයන් පිළිබඳ ව පැවති බිය ප්‍රකට කිරීමයි.
(2) ස්තූපය ආරක්ෂා කිරීමේ කාර්යය නාත් භූතයන් වෙත පැවරීමයි.
(3) සියලු ආගම්වලට සමාන ව සලකන බව තහවුරු කිරීමයි.
(4) ස්තූපය නිර්මාණය කිරීම පිළිබඳ ව නාත් භක්තිකයන් තුළ පැවති විරෝධය සමනය කිරීමයි.
(5) නාත් වන්දනය සපුරා ප්‍රතික්ෂේප නොකර, ඊට සමගාමී ව බුදුදහම ප්‍රචලිත කිරීමයි.

41. ක්‍රි.ව. 1871 බුරුමයේ මණ්ඩලේ නුවරදී පවත්වන ලද පස්වම ධර්ම සංගායනාව අවසානයේදී සිදුකරන ලද ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක්කේ,
(1) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමයි.
(2) ත්‍රිපිටකය මුඛ පරම්පරාගත ව පවත්වාගෙන යාමට භාණක පරපුරක් ඇති කිරීමයි.
(3) දූසිල් මහණුන් සසුනින් නෙරපීමයි.
(4) ත්‍රිපිටකය කිරිගරුඬ පුවරුවල කොටවා ලෝකමාරජින දාගැබ වටා තැන්පත් කිරීමයි.
(5) ත්‍රිපිටක ග්‍රන්ථ කදාසන්න රාජ්‍යයන් වෙත යවා ආරක්ෂා කිරීමයි.

42. ශ්‍රී ලංකාව හා ථායිලන්තය අතර අතීතයේ සිට පැවති සංස්කෘතික සබඳතා දෙරටේම බුදුසමයේ පෝෂණයට හේතු වූ අතර විශේෂයෙන් ලක්දිව බුදුසමයේ උන්නතිය විෂයයෙහි එමගින් ලැබුණු පිටිවහල ඉමහත් ය. ඒ අනුව දෙරට අතර පැවති ප්‍රබල සංස්කෘතික සබඳතා තහවුරු කරන සිදුවීමක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) ශ්‍යාමෝපාලි නිකාය පිහිටුවීමයි.
(2) අමරපුර නිකාය පිහිටුවීමයි.
(3) රාමඤ්ඤ නිකාය පිහිටුවීමයි.
(4) දෙරටේ පාලි ත්‍රිපිටකය සසඳා බැලීමයි.
(5) ආපදාපන්න අවස්ථාවලදී ශ්‍රී ලාංකේය භික්ෂූන්ට ආරක්ෂාව සලසාදීමයි.

43. ක්‍රි.ව. 6 වෙනි සියවසේ කොරියානු දූත පිරිසක් විසින් ජපානයට බුදුදහම හඳුන්වාදීමෙන් පසු සාම්ප්‍රදායික ෂින්තෝ භක්තික කුලවතුන් බුදුදහම ව්‍යාප්තවීමට එරෙහි ව, බුදුදහම පිළිගත් පිරිස සමග යුධ වදිද්දී දිවිහිමියෙන් එය රැක ගැනීමට ක්‍රියා කෙළේ
(1) කිම්මෙයි අධිරාජයා ය. (2) ෂෝතොකුතයිෂි ය. (3) සොග වංශිකයන් ය.
(4) මොනොනොබෙ වංශිකයන් ය. (5) නකතොමි වංශිකයන් ය.

44. ජපානයේ ප්‍රකට බෞද්ධ උත්සව අතර 'හනමත්සුරි' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) මළවුන් පිදීමේ උත්සවයයි.
(2) මත් පානෝත්සවයයි.
(3) ශාක්‍යමුනි බුදුරදුන්ගේ පරිනිර්වාණ උත්සවයයි.
(4) ශාක්‍යමුනි බුදුරදුන්ගේ බුද්ධත්වය සැමරීමේ උත්සවයයි.
(5) ශාක්‍යමුනි බුදුරදුන්ගේ උපන්දින උත්සවයයි.

45. චීනය තුළ බුදුසමය සංවර්ධනය හා ව්‍යාප්තිය සිදුවූයේ චීන භික්ෂු භික්ෂුණීන්ගේ ඉමහත් කැපවීම හා අධිරාජවරුන්ගේ නොමඳ අනුග්‍රහය ද කරණකොටගෙනයි. මෙහිලා, හැං සහ ටැං අධිරාජ්‍ය යුගයන්හි දී චීන භික්ෂූන්ගේ මූලිකත්වයෙන් සිදුකරන ලද ශාස්ත්‍රීය කාර්යය චීනය තුළ බුදුසමය ව්‍යාප්තවීමට හා චිරස්ථායි වීමට බෙහෙවින් ඉවහල් විය. එම සුවිශේෂ ශාස්ත්‍රීය කාර්යය වූයේ,
(1) යුවාන් නමින් බෞද්ධ දේශනා ක්‍රමය ව්‍යාප්ත කිරීමයි.
(2) මහායාන බෞද්ධ ග්‍රන්ථවලට අටුවා සම්පාදනය කිරීමයි.
(3) භාරතයේ සිට බෞද්ධ ධර්ම විනය ග්‍රන්ථ ගෙන්වා ගැනීමයි.
(4) බෞද්ධ වචන තිස්පන් දහසක් පමණ චීන භාෂාවට එක් කිරීමයි.
(5) බෞද්ධ අධ්‍යාපනය සඳහා විහාරස්ථාන මුල් කරගෙන අධ්‍යාපන ආයතන බිහිකිරීමයි.

46. බුදුපිළිම නිර්මාණකරණයේදී බුදුරජාණන් වහන්සේගේ අත් සහ ඇඟිලි උපයෝගී කරගෙන නිර්මාණය කරනු ලබන හස්ත සන්නිවේදන ක්‍රමය මුද්‍රා නමින් හැඳින්වේ. භාරතයේ හා ශ්‍රී ලංකාවේ බුදුපිළිමවල මෙවැනි ප්‍රකට මුද්‍රා හයක් සොයාගෙන ඇත. මෙම මුද්‍රා අතර අභය මුද්‍රාව නිරූපණය වන බුද්ධ ප්‍රතිමාවක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාවයි.
(2) අවුකන ප්‍රතිමාවයි.
(3) පොළොන්නරුව ගල් විහාරයේ පිහිටි ප්‍රතිමාවයි.
(4) බරණැස සාරානාත් බුද්ධ ප්‍රතිමාවයි.
(5) බදුලු දිස්ත්‍රික්කයෙන් හමු වී දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති ප්‍රතිමාවයි.

47. අනුරාධපුර ථූපාරාම ස්තූපය වට කොට චේතියඝරයක් නිර්මාණය කර තිබූ බව පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු වී ඇත. මෙම චේතියඝරය ඉදිකරන ලද්දේ,
(1) දේවානම් පියතිස්ස රජතුමා විසිනි. (2) පළමුවන මුගලන් රජතුමා විසිනි.
(3) ධාතුසේන රජතුමා විසිනි. (4) දුටුගැමුණු රජතුමා විසිනි.
(5) වසභ රජතුමා විසිනි.

48. ගාන්ධාර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාවල විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) දෙනෙත් අඩවන් ව තිබීමයි.
(2) කම්මුල් පිම්බී තිබීමයි.
(3) හිසකෙස් කැරලි ගැසී ශෛලීගත ව තිබීමයි.
(4) දෙනෙත් විවෘත ව තිබීමයි.
(5) අත් සිරුරින් ඈත් ව පිහිටා තිබීමයි.

49. අජන්තා සම්ප්‍රදාය අනුව නිර්මාණය කොට ඇතැයි සැලකෙන සීගිරි සිතුවම් අද්විතීය ශ්‍රී ලාංකේය කලා නිර්මාණයකි. සීගිරියෙහි අලංකාර කාන්තා සිතුවම් පන්සියයක් පමණ පෙර දවස පැවති බව සීගිරි කුරුටු ගී වලින් පැහැදිලි වේ. එහෙත් දැනට ශේෂව ඇත්තේ සිතුවම් කිහිපයක් පමණි. රන්වන් හා නිල්වන් පාටින් යුක්ත මෙම කාන්තා සිතුවම් පිළිබඳ විවිධ විචාරකයන් විසින් විවිධ මත ඉදිරිපත් කොට ඇත. මෙම විචාරක මත අතර එච්.සී.පී. බෙල් මහතාගේ මතය වන්නේ, සීගිරි සිතුවම්වලින්,
(1) අප්සරාවන් නිරූපණය වන බවයි.
(2) කාශ්‍යප රජුගේ බිසෝවරුන් හා සේවිකාවන් මල් රැගෙන පිදුරංගල විහාරයට වන්දනාවේ යාම නිරූපණය වන බවයි.
(3) විදුලිය හා මේඝය නිරූපණය වන බවයි.
(4) කාශ්‍යප රජුගේ අභාවයෙන් ශෝක වන බිසෝවරුන් නිරූපණය වන බවයි.
(5) කුවේරයාගේ ආලකමන්දාව නිරූපණය වන බවයි.

50. සිංහල සාහිත්‍යය ප්‍රධාන වශයෙන් ම පෝෂණය වූයේ බුදුදහමෙන් බව පැරණි ශ්‍රී ලාංකේය සාහිත්‍ය කෘති පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. අතීත ශ්‍රී ලාංකික ගත්කරුවෝ බුදු ගුණ හා විවිධ බෞද්ධ තේමා පාදක කරගෙන සාරවත් සාහිත්‍ය නිර්මාණ සිදු කළහ. දඹදෙණි යුගයේ දී ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලිය ද එවැනි උසස් සාහිත්‍ය නිර්මාණයකි. මේ අනුව සද්ධර්මරත්නාවලිය රචනා කිරීම පිණිස පාදක කර ගනු ලබන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ අරහං ගුණයයි.
(2) බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථි ගුණයයි.
(3) බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ගුණයයි.
(4) බෝසත් පාරමිතා ගුණ වර්ණනා කරන ජාතකට්ඨ කථාවයි.
(5) ධම්මපද ගාථා විවරණය කිරීමට රචිත ධම්මපදට්ඨ කථාවයි.

* * *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/ க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம் **45**

විෂයය / பாடம் **බෞද්ධ ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 3 | 31. | 3 | 41. | 4 |
| 02. | 5 | 12. | 2 | 22. | 4 | 32. | 4 | 42. | 1 |
| 03. | 1 | 13. | 4 | 23. | 2 | 33. | 1 | 43. | 3 |
| 04. | 3 | 14. | 5 | 24. | 4 | 34. | 1 | 44. | 5 |
| 05. | 2 | 15. | 2 | 25. | 5 | 35. | 2 | 45. | 4 |
| 06. | 3 | 16. | 1 | 26. | 3 | 36. | 1 | 46. | 2 |
| 07. | 5 | 17. | 4 | 27. | 5 | 37. | 1 | 47. | 5 |
| 08. | 1 | 18. | 5 | 28. | 1 | 38. | 3 | 48. | 1 |
| 09. | 4 | 19. | 2 | 29. | 3 | 39. | 2 | 49. | 2 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40 | 5 | 50 | 5 |

✪ **විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :**

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

2018.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) චතුර්විධ ආශ්‍රම ධර්ම හඳුන්වා දෙන්න.
(ii) බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය පිළිබඳ බුදුසමයේ ආකල්පය පැහැදිලි කරන්න.
(iii) බුද්ධ කාලීන භාරතීය සමාජය නාගරීකරණයට ලක්ව තිබූ බවට සාධක **හතරක්** ගෙනහැර දක්වන්න.
(iv) අජිතකේසකම්බලගේ දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය හඳුන්වා දෙන්න.
(v) බුදුරජාණන් වහන්සේ හා වජ්ජි ජනපදය අතර පැවති සබඳතා තහවුරු කරන සාධක **හතරක්** ගෙනහැර දක්වන්න.

**2.** (i) ඊශ්වර නිර්මාණවාදය මගින් පුද්ගල ස්වාමිත්වය සීමාකරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) කාන්තාව බුදුසමයෙන් ඇගයීමට ලක් වූ අවස්ථා **තුනක්** ගෙනහැර දක්වන්න.
(iii) "පරිත්‍යාගය" බෞද්ධ දේශපාලන ඉගැන්වීමක් ලෙස විග්‍රහ කරන්න.
(iv) සිගාලෝවාද සූත්‍රය අනුව මිතුරන් හා මිතුරන් අතර පැවතිය යුතු යුතුකම් හා වගකීම් නම් කරන්න.
(v) කාමමිථ්‍යාචාරයෙන් වැළකීමේ වටිනාකම කෙටියෙන් දක්වන්න.

**3.** (i) දස කුසල් නම් කරන්න.
(ii) අත්තූපනායික ධර්මපර්යාය පිළිබඳ විවරණයක් සපයන්න.
(iii) "අන්වීසුඛය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(iv) "සමජීවිකතාව" මූලාශ්‍රය ඇසුරින් පහදා දෙන්න.
(v) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් වර්තමාන සමාජයට ලබා ගත හැකි ආදර්ශය කෙටියෙන් දක්වන්න.

## II කොටස

**4.** (i) "අධික තෘෂ්ණාව සමාජ ගැටලු ඇතිවීමට ඉවහල් වේ". බෞද්ධ ඉගැන්වීම ඇසුරින් සාකච්ඡා කරන්න.
(ii) 'ස්වච්ඡන්දතාව' පුද්ගල හා සමාජ සංවර්ධනයට ඉවහල් වන අයුරු බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ප්‍රකට කරන්න.
(iii) ධාර්මික ධනෝපාර්ජන මාර්ග ලෙස කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය බුදුදහමේ අගය කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.
(iv) සම්පත් පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට ඉවහල් වන ආකාරය "භෝග සුඛය" ඇසුරින් පෙන්වා දෙන්න.

5. (i) බුදුරජාණන් වහන්සේ සතුව පැවති "ඥාන විශේෂ" පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   (ii) ශාස්තෘවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේගේ සාර්ථකත්වයට බලපෑ හේතු සාධක විමර්ශනය කරන්න.
   (iii) බුද්ධ කාලීන භාරතයේ පැවති රාජාණ්ඩු නම් කොට රාජාණ්ඩුවල ක්‍රියාත්මක වූ පරිපාලන ව්‍යුහය ගෙනහැර දක්වන්න.
   (iv) උපසම්පදා ක්‍රම නම් කොට ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව හඳුන්වා දෙන්න.

6. (i) බුද්ධ කාලීන භාරතය තුළ බුදුදහමේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු සාධක සැකෙවින් දක්වන්න.
   (ii) තෙවන ධර්ම සංගායනාව ශාසනයේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය විෂයයෙහි දායක වූ අයුරු පැහැදිලි කරන්න.
   (iii) අශෝක ධර්මය සකස් කර ගැනීමේදී බුදුදහමෙන් ලද ආභාසය කෙතෙක්දැයි පරීක්ෂා කරන්න.
   (iv) පැරණි භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදු වූ ධර්මශාස්ත්‍රීය සේවාව ඇගයීමට ලක් කරන්න.

7. (i) භාරතීය සම්භවයක් සහිත ආගම් මහින්දාගමනයට පෙර ලක්දිව ප්‍රචලිත ව පැවති බව මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.
   (ii) මිහිඳු හිමියන්ගේ ධර්මදූත සේවාවෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ හේතු යුක්ති විමර්ශනය කරන්න.
   (iii) ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමට අභයගිරි සම්ප්‍රදායයෙන් ඉටු වූ මෙහෙය අගය කරන්න.
   (iv) බුරුම ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා දෙරටෙහිම බුදුසමයේ පෝෂණයට ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.

8. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී යොදා ගත් විවිධ මුද්‍රා සනිදර්ශනව හඳුන්වා දෙන්න.
   (ii) භාරතීය සාංචි ස්තූපයට සාපේක්ෂව ශ්‍රී ලාංකේය ස්තූපවල පවත්නා ආකෘතිකමය වෙනස්කම් පෙන්වා දෙන්න.
   (iii) සඳකඩපහණ ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ අනන්‍යතාව තහවුරු කරන නිර්මාණයක් ලෙස ඇගයීමට ලක් කරන්න.
   (iv) සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු පිටිවහල සාහිත්‍ය කෘති **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

***

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

## I කොටස

**01. (i) චතුර්විධ ආශ්‍රම ධර්ම හඳුන්වා දෙන්න**

- බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව පුද්ගල ජීවිතය අවධි හතරකට බෙදා ඇත.

  i. බ්‍රහ්මචාරී
  ii. ගෘහස්ථ
  iii. වානප්‍රස්ත
  iv. සන්‍යාසී

* බ්‍රහ්මචාරී- ශිෂ්‍යයෙකු වශයෙන් උගතමනා වේදය හා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමේ කාලයයි.

* ගෘහස්ථ - විවාහ ජීවිතයට ඇතුළත්ව අඹු දරුවන් පෝෂණය කිරීම හා පස්කම් සුව අනුභව කරමින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීම. පිරිමි දරුවෙකු බිහි කිරීම අනිවාර්ය වේ.

* වානප්‍රස්ත - තවුස්දම් රැකීම සඳහා වනගතවීම, එහිදී සිය භාර්යාව පරිද්දි බිරිය ද කැටිව යා හැකිය.

* සන්‍යාසී - බ්‍රහ්මසහව්‍යතාව අපේක්ෂාවෙන් අනාගාරිකව, භුදකලා, සංචාරක, පූජක ජීවිතයක් ගත කළ යුතු බව.

ඉහත කරුණු පදනම්ව පිළිතුර සකස් විය යුතුය.

**(ලකුණු 4 )**

**01. (ii) බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය පිළිබඳ බුදුසමයේ ආකල්පය පැහැදිලි කරන්න**

- චතුර්වර්ණයේ ප්‍රභවය පිළිබඳ කරුණු දීඝ නිකායෙහි අග්ගඤ්ඤ සූත්‍රයේදී ඉදිරිපත් කර ඇත. එහි දැක්වෙන පරිදි පුරාණයේ ජීවත් වූ මිනිසුන් අතුරින් එක්තරා පිරිසක් "අප අතර පාපී හැසිරීම් ඇති වී තිබේ. අපි ඒ පව්කම් බැහැර කළ යුත්තෝ වෙමු." යි සිතූහ. පව් බැහැර කරන්නෝ යන අරුතින් බ්‍රාහ්මණ නම් වූ ඔවුහු වනගතව, කොළ අතුවලින් පන්සල් ඉදිකරගෙන දිනපතා ගම් නියම් ගම් වැද පිඩු සිඟා වළඳමින් යළි වනයට ගොස් භාවනා කිරීමේ යෙදුණහ. භාවනාව හෙවත් ධ්‍යාන වඩන හෙයින් ඔවුහු "ඣායක" නම් වූහ. ඔවුන් අතුරෙන් සමහරු හරිහැටි භාවනා කරන්නට අසමත්ව යළි නියම් ගම්හි වාසයට අවුත් පත පොත ලියමින්, හදාරමින් වසන්නට පටන් ගත්හ. ධ්‍යාන වැඩීම හෙවත් භාවනාව අත්හළ හෙයින් ඔවුන් "අජ්ඣායක" නමින් හැඳින්වීය.

"පාපකා අකුසලෙ ධම්මෙ බාහෙන්තීති ඛො වාසෙට්ඨා බ්‍රාහ්මණා බ්‍රාහ්මණාත්වෙව පඨමං අක්ඛරං උපනිබ්බත්තං..."

මෙම කරුණු ඇතුළත් ව පිළිතුර සකස්වීම ප්‍රමාණවත්ය.

**(ලකුණු 4)**

**01. (iii) බුද්ධකාලීන භාරතීය සමාජය නාගරීකරණයට ලක්ව තිබූ බවට සාධක හතරක් ගෙන හැර දක්වන්න.**

- පාරිභෝගික භාණ්ඩ හුවමාරු වාණිජ ක්‍රමයෙන් ඇත් වී මුදල් භාවිතයට ක්‍රමයෙන් හුරු වීම. (උදා: මස්ස, අඩමස්ස, කහවනුව, රාජ මුද්‍රාව, සහිත කාසි භාවිතය)
- බැංකු කටයුතු පැවැතීම (උදා: ණය දීම, ණය ගැනීම වැනි කටයුතු පැවතීම)
- වෙළඳ නගර නිර්මාණය වීම (උදා: බරණැස, උදේනි, පාඨලී පුත්‍ර, සාවත්ථිය)
- විනෝදාස්වාදය ගෙන දෙන සැණකෙළි පැවැත්වීම (උදා: ගිරග්ගසමජ්ජ)
- සුරා සැල්, ගණිකා නිවාස හා ඔට්ටුපොළවල් නාගරික සමාජයේ පැවතීම
- මුදල් ඔට්ටුවට තබා කරන සූදු ක්‍රීඩා වැනි ක්‍රියාකාරකම් පැවතීම
- භාෂාව, අදහස් උදහස්, ආහාරපාන, ඇඳුම් පැළඳුම් ආදියෙහි විෂමතාවන් තිබීම
- භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී ජාත්‍යන්තර මාර්ග හා බද්ධ වීම (සේද මාවත වැනි)
- උසස් වංශිකයන්ගේ හා සිටුවරුන්ගේ දරුවන් තක්සලා ආදී උසස් අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනීම
- නගරය තුළ ඇති නැති පරතරය නිසා ධනවතුන් මෙන් ම දුප්පතුන් ද සිටි බව.

ආදී කරුණු දැක්විය හැකිය.

(ලකුණු 4 )

**01. (iv) අජිත කේසකම්බලගේ දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය හඳුන්වා දෙන්න.**

- දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේදී අජිත කේසකම්බල ශාස්තෘවරයාගේ දර්ශනය ලෙස දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය හඳුන්වා ඇත.
- නත්ථි දින්නං නත්ථි යිට්ඨං.......... ආදී වශයෙන් එම දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය විස්තර කෙරේ.

01. දුන් දෙයෙහි විපාක නැත
02. යාගයෙහි විපාක නැත
03. හෝමයෙහි විපාක නැත
04. හොඳ නරක ක්‍රියාවල පල විපාක නැත.
05. මෙලොවක් නැත
06. පරලොවක් නැත
07. මව නැත
08. පියා නැත
09. ඕපපාතික සත්ත්වයන් නැත
10. මෙලොව පරලොව ඥානයෙන් දැන, ආර්යමාර්ගයට පැමිණි, යහපත අයහපත දැන මැනවින් පිළිපදින හා දේශනා කරන මහණ බමුණන් නැත.

යනුවෙන් දැක්වෙන්නේ එම දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය යි.

(ලකුණු 4 )

**01. (v) බුදුරජාණන් වහන්සේ හා වජ්ජි ජනපදය අතර පැවති සබඳතා තහවුරු කරන සාධක හතරක් ගෙනහැර දක්වන්න.**

- විශාලා මහනුවර තුන්බිය දුරු කිරීම සඳහා රතන සූත්‍රය දේශනා කිරීම
- බුදුරජාණන් වහන්සේ පස්වන වස් කාලය විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ සිටීම.
- මහාප්‍රජාපතීගෝතමිය අෂ්ටගරුධර්ම පිළිගැනීමෙන් භික්ෂුණී ශාසනය පිහිටුවීම සිදුවූයේ ද කූටාගාර ශාලාවේදීය.
- වජ්ජි රාජ්‍යයේ පාලන මූලධර්මය ලෙස අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම දේශනා කිරීම හා වජ්ජීන්ගේ සමූහාණ්ඩු පාලන ක්‍රමය බුදුරදුන්ගේ ඇගයීමට ලක්වීම.
- බුදුරජාණන් වහන්සේ අන්තිම වස්කාලය ගත කළේ ද වජ්ජි ජනපදයේ බේලුව නම් ගමෙහි වීම.
- වජ්ජි රාජ්‍යයේ පිහිටි සුන්දර ස්ථාන බුදුරදුන්ගේ ඇගයීමට ලක් වීම.

    "රමණීයං ආනන්ද වේසාලියං ..." උදේන, ගෝතමක, සත්තම්බ, බහුපුත්‍ර, සාරන්දද, චාපාල යන චෛත්‍යස්ථාන ඇගයීමට ලක් කිරීම.

- බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත්හැරියේ ද විශාලාවේ පිහිටි චාපාල චෛත්‍යස්ථානයේදී වීම.
- වජ්ජි රාජ්‍යයෙහි කූටාගාර ශාලාවට ආනන්ද හිමියන් මගින් භික්ෂූන් වහන්සේලා රැස් කරවා තමන් වහන්සේ තුන් මසකින් පිරිනිවන්පාන බව දැනුම් දීම.
- බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම සඳහා වජ්ජි දේශයේ සිට කුසිනාරාවට වඩින අවස්ථාවේ "ආනන්දය, මා විශාලා මහනුවර දකින අන්තිම අවස්ථාව මෙය යැයි පවසමින්" එදෙස නැවත හැරී බලා ගමන් කළ බව.
- විශාලාවට අයත් අම්බපාලි වනය පිළිගැනීම හා එහි විවේක සුවයෙන් වැඩසිටීම.
- බුදුසිරුර ආදාහනයෙන් අනතුරුව වජ්ජීන් වෙනුවෙන් ද ශාරීරික ධාතු වෙන් කිරීම හා වජ්ජි රජවරුන් ධාතු පිළිගෙන චෛත්‍යයක් ඉදි කිරීම.

**(ලකුණු 4)**

**02. (i) ඊශ්වර නිර්මාණවාදය මගින් පුද්ගල ස්වාමිත්වය සීමාකරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.**

- ඊශ්වර නිර්මාණවාදය හෙවත් දේවනිර්මාණවාදය යනු සත්ත්වයා හා ලෝකය කිසියම් සර්වබලධාරී දෙවියකු විසින් මවා පාලනය කරනු ලබන බව විශ්වාස කිරීමයි.
- බුද්ධකාලය වන විට බ්‍රාහ්මණ වර්ණය මුල්කරගත් ජනතාව ඊශ්වර නිර්මාණවාදය දැඩිසේ පිළිගත්හ.
- සර්වබලධාරී දෙවියන් වහන්සේ විශ්වයේ පවත්නා පරම සත්‍ය ලෙස සලකා සියල්ල මහාබ්‍රහ්මයාගේ පාලනය මත සිදුවන බැවින් පුද්ගල ස්වාමිත්වයට ඉඩක් ලබා නොදීම.
- එමගින් පුද්ගලයාට සිතා මතා තීරණ ගැනීමේ හා ස්වාධීනව-ස්වෛරීව කටයුතු කිරීමේ හැකියාව අහිමි කිරීම.
- එහි ප්‍රතිඵලයක් ලෙස මානව පෞරුෂය බිඳවැටීම, උත්සාහය, අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය යනාදී ධනාත්මක මානව ක්‍රියාකරකම් නිෂ්ඵල බවට පත් වීම.
- නිර්මාණවාදය පදනම් ව ගොඩනැගුණු වර්ණ ධර්ම, ස්වධර්ම, ආපද්ධර්ම, ආශ්‍රම ධර්ම ආදී ඉගැන්වීම් මගින් ද පුද්ගල ස්වාමිත්වය සීමා කිරීම.

(ලකුණු 4)

**02. (ii) කාන්තාව බුදුසමයෙන් ඇගයීමට ලක් වූ අවස්ථා තුනක් ගෙනහැර දක්වන්න**

- මවක, බිරිඳක, දියණියක, උපාසිකාවක, භික්ෂුණියක වශයෙන් බුදුසමයෙන් කාන්තාව ඇගයීමට ලක්වී ඇති බව.

**මවක ලෙස...**

- කාන්තාව මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයෙන් යුතුව කටයුතු කරන බ්‍රහ්ම, පූර්වාචාර්ය, ආහුනෙය්‍ය ආදී ගුණයන්ගෙන් සපිරිබව පෙන්වා තිබීම.
- මාතා පිතා දිසා පුබ්බා... දෙමවුපියන් පූර්ව දිසාව ලෙස සැලකීම.
- මාතා පිතු උපට්ඨානං... දෙමවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් වශයෙන් දැක්වීම.
- බුදුරජාණන් වහන්සේ මහාප්‍රජාපතී ගෝතමීය ස්වකීය මව ලෙස ම සලකා සම්මානයට ලක් කිරීම
- වයස්ගත තම දෙමව්පියන්ට නොසැලකීම පරාභව හා වසලකරණ ධර්ම ලෙස පරාභව හා වසල සූත්‍රයන්හි පෙන්වා දී තිබීම
- සිගාලෝවාද සූත්‍රාගත මවුපිය දූදරු යුතුකම්වලදී මවුපිය උපස්ථානය ඇගයීම

**බිරිඳක ලෙස...**

- සිගාලෝවාද සූත්‍රාගත ස්වාමි - භාර්යා යුතුකම් ඉදිරිපත් කිරීමෙන් බිරිඳක ලෙස කාන්තාව ඇගයීමට ලක් කිරීම
- විශාඛාව පතිකුලයට යන දින සිය පියා විසින් ලබාදුන් අවවාද දහය බුදුරදුන්ගේ ඇගයීමට ලක්වීම
- සත්තභරියා සූත්‍රයේ දී භාර්යාවන් හත්දෙනෙකු අතරින් යහපත් භාර්යාවන් හතර දෙනෙකු ඇගයීමට ලක්ව තිබීම.

**දියණියක ලෙස...**

- කෝසල සංයුත්තයේ ධීතු සූත්‍රය තුළින් දියණිය ඇගයීමට ලක්කර තිබීම.

**උපාසිකාවක ලෙස**

- සුජාතා, සුමනා, සාමාවතී, ඛුජ්ජුත්තරා වැනි උපාසිකාවන්ට තනතුරු ප්‍රදානය කිරීම
- උපාසිකාවක් ලෙස සිවුවණක් පිරිස අතර ඇයට පන්සිල්, අටසිල්, ගිහි දස සිල් රකිමින් සිල්වත් ගුණවත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව
- ආධ්‍යාත්මික විමුක්ති සාධනයෙහි ලා ස්ත්‍රීත්වය බාධාවක් නො වීම.

**භික්ෂුණියක ලෙස..**

- ගිහිදිවියෙන් පැවිදි දිවියට එළඹ ධර්මාවබෝධය සලසා ගැනීමට අවස්ථාව ලබා දීම
- විශේෂ කුසලතා සහිත භික්ෂුණීන්ට තනතුරු පිරිනැමීම

ආදී කරුණු ඇතුළත්ව පිළිතුරු සකස් වීම ප්‍රමාණවත් ය.

(ලකුණු 4)

**02. (iii) "පරිත්‍යාගය" බෞද්ධ දේශපාලන ඉගැන්වීමක් ලෙස විග්‍රහ කරන්න.**

- පරිත්‍යාගය (පරිච්චාග) දස රාජ ධර්මවලට අයත් රාජ ධර්මයක් බව ජාතකපාළියේ සඳහන් වීම.
- පරිත්‍යාගය යනු යම් අරමුණක්, ඉලක්කයක් වෙනුවෙන් සිදු කරනු ලබන කැප කිරීම.
- රාජ ධර්මයක් ලෙස පාලකයකු ජනතාවගේ අභිවෘද්ධිය සහ සුභසාධනය වෙනුවෙන් කරනු ලබන කැප කිරීම පරිත්‍යාගය ලෙස හඳුනාගත හැකි බව.
- රජුගේ කාලය ජනතා සේවය පිණිස කැප කිරීම අත්‍යවශ්‍ය ගුණාංගයක් වන අතර එය ද පරිත්‍යාග ගණයට අයත් වන බව.
- පාලකයා සිය ශ්‍රමය ජනතා සුභ සිද්ධිය විෂයයෙහි යෙදවිය යුතු බව.
- පාලකයා ස්වකීය සුව පහසුව ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කැප කළ යුතු බව.
- ඒ අනුව පාලකයා භාරයේ පවත්නා ධනය ජනතාවගේ යහපත උදෙසා පරිත්‍යාගශීලීව වැයකළ යුතු බව.

(ලකුණු 4)

**02. (iv) සිගාලෝවාද සූත්‍රයට අනුව මිතුරන් හා මිතුරන් අතර පැවතිය යුතු යුතුකම් හා වගකීම් නම් කරන්න.**

**කුල පුත්‍රයා විසින් මිත්‍රයාට**

| | | | |
|---|---|---|---|
| 01. | දානයෙන් | - | දානෙන |
| 02. | ප්‍රියවචනයෙන් | - | පෙය්‍යවජ්ජෙන |
| 03. | අර්ථචර්යාවෙන් | - | අත්ථචරියාය |
| 04. | සමානාත්මතාවෙන් | - | සමානත්තතාය |
| 05. | නො රැවටීමෙන් | - | අවිසංවාදනතාය |

**මිත්‍රයා විසින් මිත්‍ර කුල පුත්‍රයාට**

| | | | |
|---|---|---|---|
| 01. | රහමෙරින් මත්වූ මිත්‍රයා රැක ගැනීමෙන් | - | පමත්තං රක්ඛන්ති |
| 02. | මත්ව සිටින මිතුරාගේ වස්තුව රැක දීමෙන් | - | පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති |
| 03. | මිතුරා උවදුරකට පැමිණිකල්හි පිහිටවීමෙන් | - | භීතස්ස සරණං හොන්ති |
| 04. | විපතේ දී අත්නොහැරීමෙන් | - | ආපදාසු න විජහන්ති |
| 05. | මිතුරාගේ දරු මුණුබුරන්ට සංග්‍රහ කිරීමෙන් | - | අපරපජාචස්ස පටිපූජෙන්ති |

(ලකුණු 4 )

**02. (v) කාමමිථ්‍යාචාරයෙන් වැළකීමේ වටිනාකම කෙටියෙන් දක්වන්න.**

- කාමමිථ්‍යාචාරයෙන් වැළකීම ලෞකික හා ලෝකෝත්තර උභයාර්ථ සාධනයට උපකාරී වීම
- ගෘහස්ථ ප්‍රතිපදාවට අදාළ ප්‍රධානතම සදාචාර මාර්ගය වන පඤ්චශීලයේ තෙවන ශික්ෂාපදය "කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" (කාමයන්හි වැරදි ලෙස හැසිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි) ලෙස දක්වා තිබීම.
- මිථ්‍යාකාමය හෙවත් වැරදි කාමයෙන් වෙන්වීම මෙයින් අදහස් වන බව.
- මෙම ශික්ෂාපදය සෘජුවම ගිහියාගේ ලිංගික ජීවිතය, පවුල් ජීවිතය හා බද්ධවූවක් ලෙස තේරුම් ගතයුතු බව
- ස්වාමිපුරුෂයා සිය බිරිඳගෙන් සෑහීමකට පත් නොවී පරඹුවන්, ගණිකාවන් හෝ වෙනත් ස්ත්‍රීන් වෙත යාම සහ බිරිඳ සිය සැමියාගෙන් අතෘප්තිමත් ව පරපුරුෂයන් වෙත යාම කාමමිථ්‍යාචාරයයි.
- ලිංගික ඇසුර සිය බිරිඳට හා ස්වාමිපුරුෂයාට සීමාකරගැනීමෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම බොහෝ ප්‍රතිලාභ ලැබෙන බව.

- වර්තමානයේ Aids වැනි මාරාන්තික රෝග වේගයෙන් ව්‍යාප්ත වන අතර තෙවන ශික්ෂාපදය රැකීමෙන් Aids ඇතුලු සියලු සමාජ රෝගවලින් මිදීමට හැකියාව ලැබීම
- පවුල් සංස්ථාව තුළ සාමය, සමාදානය හා සෞභාග්‍යය වර්ධනය වන බව
- ස්ත්‍රී පුරුෂයන් කාමධූර්තවීම ආර්ථික පරිහාණියට පත්වන ප්‍රධාන හේතුවක් වන අතර මිථ්‍යාකාමයෙන් වැළකීමෙන් ආර්ථික සුරක්ෂිතතාව ඇති වන බව
- මිථ්‍යාකාමය වෙනුවෙන් වැයවන කාලය පවුලේ හා ආර්ථික කටයුතු ආදිය වෙනුවෙන් අර්ථවත් ව වැය කිරීමට හැකි වීම
- පරඹුවන් පරපුරුෂයන් වෙත නොයාමෙන් සියදරුවන්ගේ හා නිවසේ ආරක්ෂාව තහවුරු වීම.
- කාමමිථ්‍යාචාරය පුද්ගලයකුගේ අපකීර්තිය පැතිරයාමට හේතුවක් වන අතර, ඉන් වැළකීමෙන් කීර්තිය වර්ධනය වීම

(ලකුණු 4)

**03. (i) දස කුසල් නම් කරන්න.**

පාණඝාතපරද්දබ්බං - පරදාරඤ්ච කායතො
මුසා පෙසුඤ්ඤ ඵරුසා - සම්ඵප්පලාපා වාචතො
අභිජ්ඣාවේචවයාපාදො - මිච්ඡාදිට්ඨී ච මානසො

යන ගාථාවෙහි අන්තර්ගත දස අකුසල කර්මයන්ගෙන් වෙන්වීම දස කුසල් ලෙස හැඳින්වෙන බව

01. ප්‍රාණඝාතයෙන් වැළකීම (පරපණ නැසීමෙන් වැළකී කාරුණික වීම)
02. අදත්තාදානයෙන් වැළකීම (සොරකම් කිරීමෙන් වැළකී අනුන් සතු දෑ ආරක්ෂා කිරීම)
03. කාමමිථ්‍යාචාරයෙන් වැළකීම (කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී සදාචාර සම්පන්න වීම)
04. මුසාවාදයෙන් වැළකීම (බොරුකීමෙන් වැළකී සත්‍ය වචන කතාකිරීම)
05. පරුෂාවාචයෙන් වැළකීම (රළු වචන කීමෙන් වැළකී මිහිරි වචන කතාකිරීම)
06. පිසුණාවාචයෙන් වැළකීම (කේලාම් කීමෙන් වැළකී අනුන් සමගි කරවන සේ කතාකිරීම)
07. සම්පප්‍රලාපයෙන් වැළකීම (හිස් වචන කීමෙන් වැළකී අර්ථවත් වචන කතාකිරීම)
08. අභිධ්‍යාවෙන් වැළකීම (දැඩි ලෝභයෙන් වැළකී පරිත්‍යාගශීලී වීම)
09. ව්‍යාපාදයෙන් වැළකීම (ද්වේශයෙන් වැළකී මෛත්‍රියෙන් යුක්ත වීම)
10. මිථ්‍යාදෘෂ්ටියෙන් වැළකීම (වැරදි දෘෂ්ටිවලින් වැළකී නිවැරදි දෘෂ්ටි ඇති කර ගැනීම)

(ලකුණු 4)

**03. (ii) අත්තූපනායික ධර්මපර්යාය පිළිබඳ විවරණයක් සපයන්න.**

- අත්ත + උප + නායික = තමා වෙත පමුණුවන ලද ධර්මය - අත්තූපනායික ධර්මයයි.

- යම් ක්‍රියාවක් තමා වෙත ආරෝපණය කොට "මෙය මට සිදුවූවක් නම් මම කෙසේ ක්‍රියා කරම් දැයි" සිතා කටයුතු කිරීම

  උදා : සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො
  අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ.

  සියලු සත්ත්යෝ දඬුවමට, මරණයට බිය වෙති, එහෙයින් තමා උපමා කොට හිංසා නො කරන්න, ඝාතනය නො කරන්න.

- සියලු සත්ත්වයෝ සැප කැමති වෙති (**සුඛකාමා**), දුක පිළිකුල් කරති (**දුක්ඛපටික්කූලා**), ජීවත් වීමට කැමති වෙති (**ජීවිතුකාමා**), මරණයට අකමැති වෙති (**අමරිතුකාමා**)
- මෙම තත්ත්වය තමාට ද පොදු බැවින් සෙසු සත්ත්වයන් දෙස ද තමා පිළිබඳව මෙන් දැකීමෙන් සදාචාර නො වන ක්‍රියාවන්ගෙන් වැළකීම

  "අත්තාධිපතෙය්‍ය" - තමා අධිපති කොට කල්පනා කිරීම යනු ද අත්තූපනායික ධර්ම පර්යායක් බව

(ලකුණු 4 )

**03. (iii) "අත්ථිසුඛය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.**

- දැහැමින් උපයා ගන්නා ලද භෝග සම්පත් තමා සතුව ඇතැයි සිතීමෙන් ලබන සැපය අත්ථි සුඛය ලෙස අනණ සූත්‍රයෙහි සඳහන් වීම

  සො භොගා මෙ අත්ථි උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධාති අධිගච්ඡති සුඛං. අධිගච්ඡති සොමනස්සං. ඉදං වුච්චති ගහපති අත්ථිසුඛං.

  "ගෘහපතිය, අත්ථි සුඛය නම් කවරේ ද? උට්ඨාන වීර්යයෙන්, දෑතේ මහන්සියයෙන්, දහදිය හෙළා, ධාර්මික ව, දැහැමින් ලද භෝග මට ඇතැයි භෝග ඉපයූ තැනැත්තා සැපයට පැමිණේ. සොම්නසට පැමිණේ, ගෘහපතිය මෙය අත්ථිසුඛ යැයි කියනු ලැබේ"

(ලකුණු 4)

**03. (iv) "සමජීවිකතාව" මූලාශ්‍රය ඇසුරින් පහදා දෙන්න.**

- ව්‍යග්සපජ්ජ සූත්‍රයෙහි සමජීවිකතාව විග්‍රහ කර ඇත්තේ,

"ව්‍යග්සපජ්ජය, මේ ලෝකයෙහි කුල පුත්‍රයෙක් භෝගයන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නො කොට, අඩුත් නො කොට සමව දිවි ගෙවයි. මෙසේ මාගේ අය, වැය ඉක්මවා සිටී. මෙසේ මාගේ වැය, අය ඉක්මවා නො සිටී," යනුවෙන් සලකා කටයුතු කිරීම.

"ව්‍යග්සපජ්ජය, යම් සේ තරාදියෙන් බඩු කිරන්නෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ තරාදිය ගෙන මෙපමණ බරකින් පහත් වී යයි පෙනී, මෙපමණ බරකින් උස් වී යයි පෙනී දැන ගනී ද එසේම කුල පුත්‍රයා භෝගයන්ගේ අය ද වැය ද විමසා දැන ඉතා වැඩිත් නො කොට අඩුත් නො කොට මෙසේ වියදම් කිරීමෙන් මාගේ අය, වැය ඉක්මවා සිටී. වැය අය ඉක්මවා නො සිටී. යයි පමණ දැන වියදම් කිරීමෙන් සමව දිවි ගෙවයි.

අයං ච භෝගානං විදිත්වා වයං ච භෝගානං විදිත්වා සමජීවිකං කප්පෙති......

(අං.නි 5.)

**(ලකුණු 4)**

**03. (v) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් වර්තමාන සමාජයට ලබා ගත හැකි ආදර්ශ කෙටියෙන් දක්වන්න.**

පද්මය වනාහි දියෙහි ඉපිද, දියෙහි වැඩී දියෙන් උඩට පැමිණ දිය හා නො ගැටී නො තැවරී සුවඳවත් ව, මනෝරම්‍යව විරාජමාන වේ. එසේ ම බුදුරජාණන් වහන්සේ ද මිනිස් ලොව කෙලෙස් ගහණ වූ මිනිස් සමාජයේ ඉපි ද දියෙන් මතුව ආ පියුමක් සේ කෙලෙස් සහිත ලෝකයා හා නො ඇලී උත්තරීතරව දිවි ගෙවති. මෙය බුදුරදුන්ගේ පද්මාකාර ජීවන දර්ශනයයි.

| | | |
|---|---|---|
| යථා හි උදකෙජාතං | - | පුණ්ඩරීකං පවඩ්ඪති |
| නූපලිප්පති තොයෙන | - | සුචිගන්ධං මනොරමං |
| තථෙව ලොකෙ සුජාතො | - | බුද්ධො ලෝකෙ විරජ්ජති |
| නූපලිප්පති ලොකෙන | - | තොයෙන පදුමං යථා |

- බුදුරදුහු වෛර කරන සමාජයේ වෛරී ජනයා අතර, අවෛරී ව වාසය කිරීම, කෙලෙස් වලින් ආතුර වූවන් අතර, අනාතුර ව වාසය කිරීම, අටලෝ දහමින් කම්පා නො වීම
- නූතන සමාජයේ පවත්නා මුදල් ඉපයීමේදී මනුෂ්‍යත්වය ඉක්මවා කටයුතු කිරීම
- අතෘප්තිකර අසහනකාරී ජීවන පැවැත්ම, තරඟකාරීත්වය ආදී වූ පුද්ගල චරිත නිවැරදිව හැඩගස්වා ගැනීමෙහිලා බුදුරජාණන් වහසේගේ පද්මාකාර ජීවිතය ආදර්ශයට ගත හැකි වීම

**(ලකුණු 4)**

# II කොටස

**04. (i) "අධික තෘෂ්ණාව සමාජ ගැටලු ඇතිවීමට ඉවහල් වේ" බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සාකච්ඡා කරන්න.**

- තෘෂ්ණාව වනාහි සැප කැමති දුක පිළිකුල් කරන සත්ත්වයාගේ මූලික ලක්ෂණයක් බව
- තෘෂ්ණාවට වඩා අධික තෘෂ්ණාව (අභිධ්‍යා/ අභිජ්ඣා) සමාජ ගැටලු ඇති කරන බව
- බුදුසමයේ ඇගයීමට ලක්වන්නේ අප්පිච්ඡ හෙවත් අල්පේච්ඡ ප්‍රතිපදාව වන අතර අධික තෘෂ්ණාව හෙවත් මහිච්ඡතාව ඊට ප්‍රතිවිරුද්ධ වීම
- අධික තෘෂ්ණාව නිසා කිසිදෙයකින් තෘප්තිමත් නො වීම
- ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො - ලෝක සත්ත්වයා අතෘප්තිකරය. තෘෂ්ණාවේ දාසයෙකි.
- කහවනු වැස්සකින් වත් මිනිසා තෘප්තිමත් නො වන බව
- කාම සම්පත් පිළිබඳ අධික තෘෂ්ණාව ආර්ථික, දේශපාලන, සෞඛ්‍ය, පාරිසරික, සංස්කෘතික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී විවිධ සමාජ ගැටලුවලට ඉවහල් වන බව
- ඉන්ද්‍රිය ප්‍රීනනයෙන් තෘප්තිමත් නො වීම - සමාජය තුළ මනුෂ්‍ය ඝාතන, කාම අපරාධ, ගෘහස්ථ ආරවුල් ආදී විවිධ ගැටලු වර්ධනය වීමට හේතු වන බව
- භෝග සම්පත්වලින් සෑහීමකට පත් නො වීම නිසා හොරකම දූෂණය ආදී දුරාචාර වර්ධනය වීම

මෙවැනි සමාජ ගැටලු පදනම් කොට ගෙන පිළිතුර සකස් විය යුතුය.

**(ලකුණු 5)**

**04. (ii) "ස්වච්ඡන්දතාව" පුද්ගල හා සමාජ සංවර්ධනයට ඉවහල් වන අයුරු බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ප්‍රකට කරන්න.**

- බුදුසමය ස්වච්ඡන්දතාව අගය කරන බව.
- ස්වච්ඡන්දතාව යනුවෙන් අදහස් වන්නේ නිදහසේ සිතා මතා තීරණ ගෙන කටයුතු කිරීමට ඇති හැකියාව බව.
- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අධිච්ච සමුප්පන්නවාදය ආදිය පිළිගැනීමෙන් ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප වන බව
- පටිච්චසමුප්පාදය අනුව පුද්ගලයා සහ ලෝකය විවරණය කිරීම මගින් ස්වච්ඡන්දතාව අර්ථවත් කළ හැකි බව
- කිසිදු අදෘශ්‍යමාන පාරභෞතික බලවේගයකට පුද්ගල පෞරුෂය යටත් නො කොට නිදහස් චින්තනයට ඉඩදීම බෞද්ධ පිළිවෙත බව
- ස්වාධීනව සිතා නිවැරදි තීරණ ගෙන කටයුතු කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට උපකාරී වන බව.

- දෛවවාදයට යටත් වන පුද්ගලයා ස්වකීය කැමැත්ත අමතක කොට දෛවය වෙනුවෙන් පෙනීසිටීම සංවර්ධනයට බාධාවක් බව
- නිර්මාණවාදයට යටත් වන පුද්ගලයා සහ සමාජය පුරුෂ පරාක්‍රමයට සහ ස්වච්ඡන්දතාවට හානි කර ගන්නා බව
- අත්තකාර, පරකාර, ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු, ථාමධාතු, ඨිතිධාතු, උපක්කම ධාතු, අප්පමාද, සම්මාවායාම ආදී ප්‍රයෝග පුද්ගල පෞරුෂය නගා සිටුවීමට ධනාත්මකව ඉවහල් වන බව.

**(ලකුණු 5)**

**04. (iii) ධාර්මික ධනෝපාර්ජන මාර්ග ලෙස කෘෂිකර්මාන්තය හා සත්ත්වපාලනය බුදුදහමේ අගය කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.**

- කෘෂිකර්මාන්තය සහ සත්ත්වපාලනය ප්‍රධාන ජීවන මාර්ග දෙකක් බව
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ මෙලොව දියුණුවට හේතු වන ධාර්මික වෘත්තීන් හයක් දක්වෙන අතර, ඉන් පළමු හා දෙවන අංග කෘෂිකර්මාන්තය සහ සත්ත්වපාලනය බව
- කූටදන්ත සූත්‍රයට අනුව රටෙහි පවත්නා දුර්භික්ෂයන් නැති කිරීමට කෘෂිකර්මාන්තයෙහි යෙදෙන්නන්ට සහ ගව පාලනය කරන්නට බීජ, ආහාර ආදී පහසුකම් සැපයීමට උපදෙස් දී ඇති බව (කසීගොරක්ඛෙ බීජභත්තං අනුප්පදෙතු)
- නත්ථිපුත්ත සූත්‍රයේ ගවයා හා සමාන ධනයක් නැතැයි (නත්ථි ගො සමිතං ධනං) දක්වීම
- ධනියගෝපාල සහ කසීභාරද්වාජ ආදී සූත්‍රවල කෘෂිකර්මාන්තය සහ සත්ත්ව පාලනය පිළිබඳ සඳහන් වීම
- රාජකීය නාමවලට "ඕදන" ශබ්දය එකතු කිරීම ගෞරවයක් සේ සැලකීම - සුද්ධෝදන, අමිතෝදන, ධෝතෝදන...
- රාජකීය උත්සවයක් ලෙස වප්මඟුල පැවැත්වීම
- රජකුලය "කෙත්වතුවලට අධිපති" අර්ථයෙන් ක්ෂත්‍රිය නාමයෙන් හැඳින්වීම (ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨා ඛත්තියො)
- මගධ කෙත්යායේ ආකෘතියට අනුව සිවුර සකස් කර ගැනීමට උපදෙස් දීම

**(ලකුණු 5)**

**04. (iv) සම්පත් පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට ඉවහල් වන ආකාරය "භෝග සුඛය" ඇසුරින් පෙන්වා දෙන්න.**

- සම්පත් පරිභෝජනයේදී අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රමවේදය භෝග සුඛයෙන් ඉස්මතු කිරීම
- අනණ සූත්‍රයේ දක්වෙන චතුර්විධ සුඛ සංකල්පයෙන් භෝග සුඛය දෙවැන්න වීම
- උපයන ධනයෙන් තමා පිනවීම, දෙමවුපියන් පිනවීම, අඹුදරුවන් පෝෂණය, හිතමිත්‍රාදීන් පිනවීම, දාසි දාස් කම්කරුවන් පිනවීම, මහණ බමුණන් විෂයයෙහි දක්ෂිණාව පිහිටුවීම (අං.නි. අණන සූත්‍රය)
- දත්වා ච භුත්වා ච යථානුභාවං... යන්නෙන් ධනය පරිත්‍යාගයට සහ පරිභෝජනයට ගත යුතු බව දක්වීම සමාජ සහජීවනයට හේතුවන බව
- පඤ්චබලි සංකල්පයෙන් සමාජ සහ ආගමික යුතුකම් ඉටු කිරීමට පෙළඹවීම
- ධන කළමනාකරණයේ දක්වෙන පළමු අංගය "එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය" භෝග සුඛය ඉස්මතු කිරීම
- පත්තකම්ම වැනි සූත්‍රවල ධන පරිභෝජනය පිළිබඳ දක්වෙන කරුණු සමාජ සහජීවනයට උපකාරී වන බව

**(ලකුණු 5)**

**05. (i) බුදුරජාණන් වහන්සේ සතුව පැවති "ඥාන විශේෂ" පිළිබඳ හැඳින්වීමක් කරන්න.**

- සර්වඥතා ඥානය
- ත්‍රිවිද්‍යා ඥාන
  1. පුබ්බේනිවාසානුස්සති ඤාණය
  2. චුතූපපාත ඤාණය හෙවත් දිබ්බචක්ඛු ඤාණය
  3. ආසවක්ඛය ඤාණය
- අෂ්ට විද්‍යා ඥාන
  1. විපස්සනා ඤාණය
  2. මනෝමය ඉද්ධි ඤාණය
  3. ඉද්ධිවිධ ඤාණය
  4. දිබ්බසෝත ඤාණය
  5. පරචිත්ත විජානන ඤාණය හෙවත් චේතෝපරිය ඤාණය
  6. පුබ්බේනිවාසානුස්සති ඤාණය
  7. දිබ්බචක්ඛු ඤාණය හෙවත් චුතූපපාත ඤාණය
  8. ආසවක්ඛය ඤාණය

- දසබල ඤාණ
- චතුර්වෛශාරද්‍ය ඥානය
- උපාය කෞශල්‍ය ඥානය
- අනාවරණ ඤාණය

යනාදී ඥාන විශේෂ ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

(ලකුණු 5 )

**05. (ii) ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේගේ සාර්ථකත්වයට බලපෑ හේතු සාධක විමර්ශනය කරන්න.**

- දෙවියන් සහිත ලෝක සත්ත්වයන්ගේ උභයාර්ථ සංසිද්ධිය පිණිස අනුග්‍රහ කරන බැවින් බුදුරජාණන් වහන්සේ ශාස්තෘවරයෙකු ලෙස හැඳින්වේ. (සත්ථා දේව මනුස්සානං.......)
- ගුරුවරයා යන අර්ථය ශාස්තෘ යන්නෙහි ගැබ් ව ඇති බැවින් උන්වහන්සේ තුන් ලෝකයේ ම ගුරුවරයා ලෙසත් සැලකෙයි. (තිලෝගුරු)
- ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරදුන් සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසිකත්වය, දෘෂ්ටිමය පදනම සමාජ වටපිටාව ආදී වූ සාධක සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කොට උපාය කෞශල්‍යයෙන් දහම් දෙසීම.
- ඍජු දේශනා ක්‍රමය (දම්සක්පැවතුම් සූත්‍රය), සාකච්ඡා ක්‍රමය (කන්දරක සූත්‍රය), උපමානුසාරී දේශනා ක්‍රමය (රාහුලෝවාද සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය), පැවරුම් ක්‍රමය (චුල්ලපන්තක, කිසාගෝතමී වැනි අයට දහම් දෙසීමේදී අනුමගය කළ සාර්ථ සන්නිවේදන ක්‍රමෝපාය භාවිතය)
- ඒකංස ව්‍යාකරණීය (ඍජු පිළිතුරු සැපයීම - ආලවක සූත්‍රය)
  විභජ්ජ ව්‍යාකරණීය (විශ්ලේෂණාත්මකව පිළිතුරු දීම - චුල්ලකම්ම විභංග සූත්‍රය)
  පටිපුච්ඡා ව්‍යාකරණීය (ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීම. (චුල්ලසච්චක සූත්‍රය)
  ඨපනීය දේශනා (ප්‍රශ්න බැහැර කිරීම - චූලමාලුංක්‍යපුත්ත සූත්‍රය)
  යනාදි ක්‍රම මගින් ගැටලු විසඳීමෙහි ඇති සුවිශේෂී දක්‍ෂතාව
- අත්තජ්ඣාසය

  පරජ්ඣාසය

  අට්ඨුප්පත්තික

  පුච්ඡාවසික

  යන දේශනා ක්‍රම අනුගමනය කරමින් ධර්මය දේශනා කිරීම

- කිසිඳු ගුරු මුෂ්ටියක් නොමැති ව විවිධ දේශනා ක්‍රම මගින් ශ්‍රාවකයන්ට නොසඟවා දහම් දෙසීම (විශ්වසනීය භාවය ගොඩනගා ගෙන තිබීම) නත්‍ථානන්ද තථාගතස්ස ධම්මේසු ආචරිය මුට්ඨි.

- ශාස්තෘවරයෙකු වශයෙන් සිය අනුගාමිකයන්ගේ අරමුණු හා පරමාර්ථ භාවිතයෙහි ලා කැපවීම හා ඊට අදාළ මග පෙන්වීම. (මහාපරිනිබ්බාණ සූත්‍රය)

- ආදර්ශවත් චරිතයකින් යුතු වීම.

- යථාවාදී තථාකාරී ගුණයෙන් යුතු වීම.

- නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩ දීම.

- අන්‍ය ආගම් කෙරෙහි සුහද ආකල්පය.

- පුද්ගල ස්වාමීත්වය, තම විමුක්තිය තමාට ම පවරා දීම.

- කරුණාව, ඉවසීම, මෛත්‍රිය, තාදී ගුණය යනාදී ගුණයන්ගෙන් යුක්ත වීම.

යනාදී කරුණු ඇතුළත් ව පිළිතුර සකස් විය යුතුය.

(ලකුණු 5)

**05. (iii) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු නම් කොට රාජාණ්ඩුවල ක්‍රියාත්මක වූ පරිපාලන ව්‍යුහය ගෙන හැර දක්වන්න.**

- මගධ, කෝසල, වත්ස, අවන්ති යනුවෙන් ප්‍රබල රාජාණ්ඩු හතරක් ක්‍රි.පූ 06 සියවස වන විට භාරතයේ පැවැති බව

- ඒවායේ මූලික ලක්ෂණ ලෙස ක්‍රියාත්මක වූ පරිපාලන ව්‍යුහය මහරජ කෙනෙකු විසින් පාලනය කිරීම. තනි පුද්ගලයකු වටා බලය ඒකරාශි වී තිබීම. එනම් ව්‍යවස්ථා දායක, විධායක, අධිකරණ යන සියලු බලතල රජුට හිමි වී තිබීම.

- නීති සම්පාදනය හා ඒවා ක්‍රියාවට නැංවීම, අධිකරණ කටයුතු හා දඬුවම් පැමිණ වීම රජු විසින් සිදු කිරීම

- රාජාණ්ඩු පාලනයක මූලික ලක්ෂණයක් ලෙස පියාගෙන් පුතාට රජකම හිමි වීම

- රජුගේ තනි කැමැත්තට අනුව සියල්ල සිදු විය. රජුට අවශ්‍ය නම් ජනතා අදහස් අනුව නම්‍යශීලීව කටයුතු කිරීමට ද හැකියාව පැවතුණි. පාලකයාගේ ස්වභාවය අනුව පාලනයේ තත්ත්වය වෙනස් විය.

- යුව රජ, පුරෝහිත, සේනාපති, අධිකරණ නායක යන පුද්ගලයන් මගින් බලය ක්‍රියාත්මක කිරීම

- රාජාණ්ඩුව ව්‍යාප්ත කරමින් මහාරාජ්‍ය, මහා අධිරාජ්‍ය ගොඩ නැගීම.

(ලකුණු 5)

**05. (iv) උපසම්පදා ක්‍රම නම් කොට ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව හඳුන්වා දෙන්න.**

- ශාසනික ව්‍යවහාරය තුළ උපසම්පදා ක්‍රම අටක් භාවිත කොට ඇත.

  01. ඒහි භික්ඛු උපසම්පදාව
  02. තීහි සරණාගමන උපසම්පදාව
  03. ඕවාද පටිග්ගහණ උපසම්පදාව
  04. දූතේන උපසම්පදාව
  05. අට්ඨගරුධම්ම පටිග්ගහණ උපසම්පදාව
  06. පඤ්හව්‍යාකරණ උපසම්පදාව
  07. අට්ඨවාචික උපසම්පදාව
  08. ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව

- උපසම්පදාවට සුදුසු අවශ්‍යතා සපුරා ඇති බවත්, උපසම්පදා අපේක්ෂකයා ඊට යෝග්‍ය බවත්, ගණ පූරණය සහිත සංඝ සභාවකට දනුම් දී (ඤත්තිය තබා) තෙවරක් සංඝ සභාවේ කැමැත්ත විමසා බහුතරයේ කැමැත්ත මත සම්මුතියට එළඹීමෙන් සිදු කරනු ලබන උපසම්පදාව ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමින් හැඳින් වේ.

**(ලකුණු 5)**

**06. (i) බුද්ධකාලීන භාරතය තුළ බුදුදහමේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු සාධක සැකෙවින් දක්වන්න.**

- තර්කානුකූලව පිළිගත හැකි බුද්ධිගෝචර දහමක් වීම
- කිසිදු බැඳීමකින් තොරව තමාගේ විමුක්තිය තමාටම ලබා ගත හැකි දහමක් වීම
- ආගමික නායකයා වශයෙන් බුදුරජාණන් වහන්සේගේ දේශනා කෞශල්‍යය, ප්‍රියශීලීව කටයුතු කිරීම හා දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා අසූවක් අනු ව්‍යංජනයන්ගෙන් යුත් අසහාය රූප කායක් තිබීම.
- බුදුරජාණන්වහන්සේ සිය ශ්‍රාවක පිරිසට නිසි උපදෙස් ලබා දී ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර හැර උන්වහන්සේ ද ධර්ම ප්‍රචාරය සඳහා පිටත්ව යාම.
- බෞද්ධ ශ්‍රමණ පිරිස පරමාදර්ශී සමාජ කණ්ඩායමක් වීම.
- බෞද්ධ භික්ෂුව නොපැහැදුණු අයගේ පැහැදීම පිණිසත් පැහැදුණ අයගේ වැඩි පැහැදීම පිණිසත් පැවතීම.
- බෞද්ධ භික්ෂුවගේ ඇවැතුම් පැවතුම්හි ඇති සංවරශීලී බව.
- බුදුරජාණන් වහන්සේගේ හා ශ්‍රාවකයන් වහන්සේලාගේ අනුපමේය කැපවීම.
- තත්කාලීන රජවරුන්ගේ හා සිටුවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලැබීම.
- බුදුරජාණන්වහන්සේගේ නොසැලෙන පෞරුෂය.

යනාදී කරුණු ඇතුළත්ව පිළිතුර සකස් විය යුතුය.

**(ලකුණු 5)**

**06. (ii) තෙවන ධර්ම සංගායනාව ශාසනයේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය විෂයයෙහි දායක වූ අයුරු පැහැදිලි කරන්න.**

- දුසිල් භික්ෂූන් හෙවත් ශ්‍රමණ වේෂධාරීන් සසුනෙන් නෙරපා භේද භින්නව සිටි භික්ෂූන් සමගි කරවා ශාසන සංශෝධනය කිරීම
- එතෙක් නැවතී තිබූ ශාසනික විනය කර්ම නැවත ආරම්භ කිරීම
- බුදුදහමට එකතු වී තිබූ පරවාද 500ක් ඛණ්ඩනය කරමින් සකවාද 500ක් තහවුරු කරමින් කථාවත්ථුප්පකරණය රචනා කිරීම.
- කථාවත්ථුප්පකරණය රචනා කිරීමත් සමග අභිධර්ම පිටකය ප්‍රකරණ හතකින් යුතුව සම්පූර්ණ වීම. ඒ අනුව ත්‍රිපිටකය සම්පූර්ණ වීම.
- භාරතයේ විවිධ ප්‍රදේශ සහ විදේශීය රටවල් කිහිපයකට ම භික්ෂූන් පිටත් කර යවා බුද්ධ ධර්මය ව්‍යාප්ත කිරීම. එමගින් භාරතයේ බොහෝ ප්‍රදේශවලත්, විදේශ රටවල් ගණනාවකත් බුදු දහම චිරස්ථායි වීම.

(ලකුණු 5)

**06. (iii) අශෝක ධර්මය සකස් කර ගැනීමේදී බුදුදහමෙන් ලද ආභාසය කොතෙක් දැයි පරීක්ෂා කරන්න.**

- අශෝක දහම යනුවෙන් හඳුන්වන්නේ තමන් අගය කරන චාරිත්‍රධර්ම පද්ධතියක් රට වැසියාගේ දෙලොව අභිවෘද්ධිය සඳහා අශෝක විසින් හඳුන්වා දෙන ලද ආචාර ධර්ම පද්ධතියකි.
- මෙය බුදු දහමෙන් උකහා ගත් සරල දහම් කරුණු තුළින් සකසා ගත් කරුණාව හා මෛත්‍රිය පදනම් කර ගත් පිළිවෙත් මාලාවක් ලෙස හඳුනා ගත හැකිය.
- අශෝක දහම තුළින් බුද්ධ දේශනා රාශියක් හඳුනා ගත හැකිය. අශෝක දහම බුදුදහමේ අභාසය ලබා සකස් කර ගත්තක් බව ඒ අනුව පැහැදිලිය.
- පංචසීල ප්‍රතිපත්තිය සුරකින සමාජයක් බිහි කිරීම.
    * "පෙර දෙවියන්ට ප්‍රිය වූ පියදස්සි රජුන් මුළුතැන්ගේ නොයෙක් දහස් ගණන් සතුන් ආහාර සඳහා මරණ ලදී. සතුන් මරණ සංඛ්‍යාව අඩු කර මොණරු දෙදෙනෙක් හා මුවෙක් පමණක් මරණු ලැබේ. ටික කලකින් එය ද නතර කරන්නේය." (1 වන ගිරි ලිපිය)
    * "කිසි සතෙකු නසා යාග නොකළ යුතු ය." (1වන ගිරි ලිපිය)
    * මාඝාත අඥාව පැනවූ ආකාරය පස්වන ටැම්ලිපියේ විස්තරාත්මකව දක්වා ඇත.
    * "සත්ත්ව ඝාතනයෙන් හා හිංසනයෙන් වැළකීම රජු බලාපොරොත්තු වේ." (4 වන ගිරි ලිපිය)
    * "සත්‍ය කිවයුතුය." (බ්‍රහ්මගිරි දෙවන ගිරි ලිපිය)

- මංගල, පරාභව, සිගාලෝවාද ආදී සූත්‍රාගත කරුණු අශෝක ධර්මයේ ඇතුළත් වේ.

  * "දාසයන්, සේවකයන් කෙරෙහි මනාව පිළිපැදීම ද මාපියන් කෙරෙහි සේවාව ද මිත්‍රයන්ට, ඇසුරු කළවුන්ට, නෑදැයින්ට, මහණ බමුණන්ට දන්දීම ද කළයුතුය." (2 වන ගිරි ලිපිය)

  * "දෙමාපියන්ට සංග්‍රහ කළ යුතුය. ගරු කළ යුතුය." (3, 4, 11, 13, ගිරි ලිපි)

  * "මත් පැන් ආදිය පානය කොට පවත්වන උත්සව නොපැවැත්විය යුතුය." (1 වන ගිරි ලිපිය)

- දස රාජ ධර්ම, දස සක්විතිවත්, සතර සංග්‍රහ වස්තු සිවුබඹ විහරණ බෞද්ධ දේශපාලන මූලධර්ම ලෙස භාවිත කිරීම.

  * "ධර්ම විජය යන යමක් වෙයි නම් එය දෙවියන්ට ප්‍රිය වූ රජුගේ ප්‍රධාන විජය වෙයි." (13 ගිරි ලිපිය)

  * "යමෙක් දේව ප්‍රිය රජු හට යම් බඳු අවමාන කෙරේ ද දේව ප්‍රිය රජු ඒ සියල්ල ඉවසමින් අවමාන කරන්නාට හැකිතාක් සමාව දෙන්නේය." (13 ගිරි ලිපිය)

- ආගමික සහනශීලිත්වය තුළින් සමාජ සමගිය ඇති කිරීම

  * "සියලු ආගම්වල අය සමගි වේවා." (7 ගිරි ලිපිය)

  * "සංඝ සමගිය චිරස්ථායි වීම මාගේ කැමැත්තයි." (සාංචි ටැම් ලිපිය)

  * "යමෙක් ස්වකීය ලබ්ධියට පමණක් ගරුකරමින් අන්‍ය ලබ්ධීන්ට ගර්හා කිරීම නොකට යුතුය. අනුන් අදහන ධර්මය ඇසීමට රුචි උපදිත්වා............" (12 ගිරි ලිපිය)

- පරිසර හිතකාමී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

  * "සෑම මාර්ගයක ම නුග අඹ ආදී ගස් රෝපණය කරවමි. ඒවා මිනිසුන්ට හා තිරසනුන්ට සෙවණ දෙත්වා." ( 7වන ස්ථම්භ ලිපිය)

**(ලකුණු 5)**

**06. (iv) පැරණි භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදු වූ ධර්මශාස්ත්‍රීය සේවය ඇගයීමට ලක් කරන්න.**

- පැරණි භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාල අතර

  1. තක්ෂිලා විශ්වවිද්‍යාලය
  2. නාලන්දා විශ්වවිද්‍යාලය
  3. වික්‍රමශිලා විශ්වවිද්‍යාලය
  4. වලභි විශ්වවිද්‍යාලය
  5. ජගද්දලා විශ්වවිද්‍යාලය
  6. ඕදන්තපුරි විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල ප්‍රමුඛ වේ.

මෙම විශ්වවිද්‍යාලවලින් ඉටු වූ ධර්ම ශාස්ත්‍රීය සේවාවන් ලෙස

- දෙස් විදෙස් කීර්තියට පත් මහා ප්‍රාඥයින් බිහි වීම
- නව විශ්වවිද්‍යාල බිහි කිරීමට, විශ්වවිද්‍යාල තුළ පුළුල් ධර්ම ඥානයක් ලබා දීමට හැකි සුවිශේෂි පඬිවරුන් මෙම විශ්වවිද්‍යාල වලින් බිහි වීම.
- නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වූයේ කුලපතිය. හියුංසියෑං පැමිණෙන විට නාලන්දාවේ කුලපති තනතුර දැරූ ශීලභද්‍ර හිමි ජගද්දලා විශ්වවිද්‍යාලයේ ශිල්ප හැදෑරූ අයෙකි.
- දීපංකර ශ්‍රී ඥාන හිමියන් මහායාන ධර්මය හදාරන ලද්දේ ඕදන්තපුරි විශ්වවිද්‍යාලයෙනි. පසුව එම හිමි වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ කුලපති බවට පත් වීම
- හියුංසියෑං, ෆාහියන්, ඉට්සිං, තාරානාථ වැනි දේශ ගවේශනයේ ප්‍රමුඛ පිරිස් බිහි වීම.
- ශීලභද්‍ර තෙරුන්ගේ ශිෂ්‍යයෙක් වූ දානශීල තෙරුන් ද ජගද්දලා විශ්වවිද්‍යාලයේ ශිල්ප හදාරා ඇති අතර, උන්වහන්සේ මහායාන ධර්ම ග්‍රන්ථ හැටක් පමණ එම විශ්වවිද්‍යාලයේ දී ටිබෙට් බසට පරිවර්තනය කිරීම.
- පුළුල් විෂය ක්ෂේත්‍රයක අවබෝධයක් ලබා දීම.
- ධර්ම ග්‍රන්ථ සම්පාදනය කිරීම.
- ඉට්සිං වසර දහයක් නාලන්දාවේ රැඳෙමින් ගාථා ලක්ෂ පහක් ඇති සංස්කෘත පොත් හාරසියයක් සම්පාදනය කිරීම.
- දෙස් විදෙස් ධර්ම ප්‍රචාරක සේවාවක් සිදු වීම.

- හියුංසියැං වසර පහලොවක් නාලන්දාවේ ආචාර්යවරයෙකු ලෙස සේවය කළ චීන ජාතික හිමි නමකි. එම හිමියන් මගින් රට රටවලට දහම ව්‍යාප්ත වීම.
- රට රටවල ශිෂ්‍යයෝ පැමිණ අධ්‍යාපනයේ යෙදීම තුළින් ද ධර්ම ප්‍රචාරක සේවයක් සිදු වීම.
- වලභි විශ්වවිද්‍යාලය ථෙරවාදී බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රධානතම මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වීම.
- නාලන්දා විශ්විද්‍යාලයේ මහායාන බෞද්ධ අධ්‍යාපනය ප්‍රධානතම මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වීම.
- බුදුදහම විවිධ භාෂාවලට පරිවර්තනය වීම තුළින් විවිධ රටවලට බුදුදහම මැනවින් ව්‍යාප්ත වී ආරක්ෂා වීම.

(ලකුණු 5)

**07. (i) භාරතීය සම්භවයක් සහිත ආගම් මහින්දාගමනයට පෙර ලක්දිව ප්‍රචලිත ව පැවති බව මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.**

- ප්‍රාග් බෞද්ධ ලංකාවේ භාරතීය සම්භවයක් සහිත ආගම් පැවති බව මහාවංසය, දීපවංසය, සමන්තපාසාදිකාව, මහාබෝධිවංසය, මහාවංස ටීකාව යන මූලාශ්‍රය තුළින් හඳුනාගත හැකි බව
- බ්‍රාහ්මණ ආගම, ජෛන ආගම, පරිබ්‍රාජක හා ආජීවක ආගම්, ශිව දෙවියන් පිදීම හා බුදුදහම වැනි ආගම් ඒ අතර ප්‍රමුඛ වේ.

**බ්‍රාහ්මණ ආගම**

- විජයගේ පුරෝහිතයකු වූ උපතිස්ස නම් බමුණකු පිළිබඳ දැක්වෙන පුවත.
- පණ්ඩුල නම් බමුණකු පණ්ඩුකාභයගේ පුරෝහිතයා වීම.
- පණ්ඩුකාභය රජු හා එකට ඉගෙනගත් චන්ද්‍ර නම් බමුණකු පිළිබඳ සඳහන් වීම.
- පණ්ඩුකාභය රජු සොත්ථිශාලා නමින් දෙවොල් විශේෂයක් ඉදිකර දී තිබීම.
- මහාබෝධිවංසයේ දැක්වෙන පරිදි මහාවිහාරය සඳහා සීමා ලකුණු කරන අවස්ථාවේ දී බමුණන් සඳහා දියවාස නමින් ගොඩනැගිල්ලක් තිබූ බව
- තිවක්ක, උපතිස්ස වැනි බමුණුගම් අනුරාධපුරය අවට පැවති බව.

**ජෛන ආගම**

- පණ්ඩුකාභය යුගය වනවිට ජෝතිය, ගිරි හා කුම්භණ්ඩ නමින් ප්‍රසිද්ධ නිගණ්ඨයන් තිදෙනෙකු ගැන සඳහන් වීම.
- රජු ජෝතිය නම් නිගණ්ඨයාට නීච සුසානයට නැගෙනහිර දෙසින් ගෘහයක් කරවූ බව සඳහන් වීම.
- වලගම්බා යුගය වනවිටත් ගිරි නම් නිගණ්ඨාරාමයක් පැවති බවත්, රජු එම භූමියේම අභයගිරිය කරවූ බවත් සඳහන් වීම.

**පරිබ්‍රාජක හා ආජීවක ආගම්**

- පණ්ඩුකාභය රජු පරිබ්‍රාජකයන්ට ආරාමයක් ද ආජීවකයන්ට ගෘහයක් ද කරදුන් බව.
- මහාබෝධිවංසයට අනුව පණ්ඩුකාභය රජු දවස පරිබ්‍රාජකාරාමයක් මහා සීමාවට වම් පසින් තිබුණු බව.
- පණ්ඩුවාසදේව පරිබ්‍රාජක වේශයෙන් මෙරටට පැමිණි බව.
- භද්දකච්චානා ඇතුලු 32ක් පමණ පිරිස මෙරටට පැමිණෙන්නේ ද පරිබ්‍රාජිකා වේශයෙනි.

**ශිව දෙවියන් පිදීම**

- පණ්ඩුකාභය රජු සිවිකා ශාලා නමින් ගොඩනැගිලි විශේෂයක් ශිව භක්තිකයන් සඳහා ඉදි කර දී තිබූ බව.
- මහාවංස ටීකාවට අනුව මහසෙන් රජු දිවයිනේ සෑම ස්ථානයකම පිහිටුවා තිබූ ශිවලිංග විනාශ කළ බව.
- රජවරුන් පවා නම් යොදාගැනීමේ දී ශිව යන වචනය යොදා ගෙන තිබූ අයුරු මුටශිව, ගිරිබණ්ඩශිව වැනි නම්වලින් ප්‍රකට වන බව. මෙයින් ශිව ආගම හා බද්ධ වූ නාමයන් ජනප්‍රියව පැවති බව පෙනේ.

**බුදුදහම**

- බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් නවවැනි මාසයේ දී දුරුතු පොහොය දිනක මහියංගනයට වැඩම කළ බව.
- බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේ දී බක් පුර පසළොස්වක පොහෝ දිනයෙහි බුදුන් වහන්සේගේ දෙවන ලංකාගමනය නාගදීපයට සිදු වූ බව.
- බුද්ධත්වයෙන් අටවන වසරේ දී බුදුරජාණන් වහන්සේ තෙවන වරට කැළණියට වැඩමකිරීම හා එම ගමනේදී ම ශ්‍රීපාදය වැනි විවිධ ස්ථානයන්ට වැඩම කොට එම ස්ථානයන් පූජනීයත්වයට පත් කිරීම.
- තපස්සු භල්ලුක වෙළෙන්දන් විසින් තිරියායෙහි ගිරිහඬු සෑය නමින් ස්තූපයක් කරවන ලද බව.
- විජය, පණ්ඩුවාසදේව, භද්දකච්චානා වැනි රාජකීයයන් හා ඔවුන් සමග මෙරටට පැමිණි භාරතීය දූත පිරිස් සමග බුදුදහම පැමිණෙන්නට ඇතැයි පවත්නා මත, මේ අතර භද්දකච්චානාගේ පියා වූ සක්කපණ්ඩු රජු සුද්ධෝදන රජුගේ සහෝදරයකු වූ අමිතෝදන ශාක්‍යයාගේ පුත්‍රයකු වීම.

(ලකුණු 5)

**07.(ii) මිහිඳු හිමියන්ගේ ධර්මදූත සේවයෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ හේතු යුක්ති විමර්ශනය කරන්න.**

- තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ නවරට සසුන් පිහිටුවීමේ දී මිහිඳු හිමියන් ප්‍රමුඛ දූත පිරිස තම්බපණ්ණි දීපයට වැඩම කළ බව.
- මිහිඳු හිමියන් ප්‍රධාන ධර්ම දූතයන් වහන්සේලා තුළ පැවති සීලාදී ගුණයන් මෙන් ම නිස්සරණාධ්‍යාසයෙන් රට වැසියන්ට ධර්ම දේශනා කිරීමට කැප වී ක්‍රියා කිරීම.
- මුලින් ම පාලකයාට ධර්මය දේශනා කොට ඔහු ඇතුලු ප්‍රධාන අමාත්‍යවරුන් බෞද්ධයන් බවට පත් කිරීම හා එමගින් රට වැසියන්ට ද දහම හඳුන්වා දීමට පහසු වීම.
- පර්වත වන්දනය චෛත්‍යය වන්දනය වෙත යොමු කිරීමත්, වෘක්ෂ වන්දනය බෝධි වන්දනය වෙත යොමු කිරීමත්, ගිනි දෙවියන් පිදීම වෙනුවට පහන් පූජාව හඳුන්වා දීමත්, මළවුන් ඇදහීම වෙනුවට මළවුන්ට පිං දීමේ ක්‍රමය හඳුන්වා දීමත්, දේව වන්දනය වෙනුවට දෙවියන්ට පිං දීමේ ක්‍රමය හඳුන්වා දීමත්, වැනි ක්‍රමවේදයන් හඳුන්වා දෙමින් පැවති සමයවාදයන්ට නව අර්ථකතනයන් ලබා දී ඇත.
- ධර්මදූත කණ්ඩායමේ සංයුතිය
- චූල්ලහත්ථිපදෝපම සූත්‍රය, පේතවත්ථු විමානවත්ථු, දේවදූත, බාලපණ්ඩිත වැනි සූත්‍ර දේශනාවන්හි ප්‍රායෝගික වටිනාකම හා ඒවා තත්කාලීන සංස්කෘතියට පැවති අදාළත්වය.
- සංඝමිත්තා මෙහෙණියගේ වැඩමවීමෙන් පසු පිහිටුවන ලද භික්ෂුණී ශාසනය නිසා බුදුසසුනේ ව්‍යාප්තියට කාන්තාවන්ගේ දායකත්වය ප්‍රබලව ලැබීම හා භික්ෂුණීන්ගේ සමාජ, ආගමික, අධ්‍යාපනික සේවා
- දේවානම්පියතිස්ස රජු රාජ්‍ය නායකයා ලෙස බුදුසසුනේ ව්‍යාප්තියට සුවිසල් දායකත්වයක් සැපයීම
- මිහිඳු මාහිමියන් ධර්මාශෝක අධිරාජයාගේ පුත්‍රයකු වීම.
- මිහිඳු හිමි වැඩම කිරීමට පෙර සිට දේවානම්පියතිස්ස රජු හා අශෝක අධිරාජයා අතර පැවති සබඳතාව.

**(ලකුණු 5)**

**07. (iii) ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමට අභයගිරි සම්ප්‍රදායයෙන් ඉටු වූ මෙහෙය අගය කරන්න.**

- කිත්සිරිමෙවන් රජු දවස හේමමාලා දන්තකුමරු දෙදෙනා විසින් කළිඟු රට සිට දළදා වහන්සේ වැඩම වන ලද අතර අභයගිරිකයන් එය පිළිගැනීම, දළදා පූජාව පැවැත්වීම හා දළදා සංස්කෘතියක් ඇති කිරීම.
- භක්තිවාදය ප්‍රචලිත කිරීම හරහා පුද පූජා සංස්කෘතියක් මෙරටට හඳුන්වා දීම තුළින් මෙරට ජනයාගේ ශ්‍රද්ධාව ජනිත වන ආකාරයට ක්‍රියා කිරීම.

- බෞද්ධ ග්‍රන්ථ රචනා කිරීම හරහා ඇති කළ බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය. උදා: උපතිස්ස හිමියන්ගේ විමුත්ති මග්ගය, මහාබුද්ධරක්ඛිත හිමියන්ගේ රාජවංස පුස්තකය, ආර්යදේව හිමියන්ගේ චතුස්සතකය, ආර්යශූර හිමියන්ගේ ජාතකමාලාව, බුද්ධමිත්ත හිමියන්ගේ ශ්‍රමණදූත කාව්‍යය, ආනන්ද හිමියන්ගේ සද්ධම්මෝපායනය, බුද්ධදාස රජුගේ සාරාර්ථ සංග්‍රහය.

- මහායාන බුද්ධාගම මෙන් ම පුරාවිද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය වැනි ලෞකික විෂය ධාරාවන් ද උගන්වන ආයතනයක් වීම.

- මූලායතන හරහා බෞද්ධ අධ්‍යාපනය රටපුරා ව්‍යාප්ත කිරීම.

- ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස විදේශීය උගතුන් පිළිගැනීම හා ඔවුන් හරහා මෙරට බෞද්ධ ප්‍රබෝධය ජාත්‍යන්තරය දක්වා රැගෙන යාම.

**(ලකුණු 5)**

**07. (iv) බුරුම ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා දෙරටෙහිම බුදුසමයේ පෝෂණයට ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.**

- මියන්මාරය හා ශ්‍රී ලංකාව අතර පැවති බෞද්ධ සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ මහාවංශ, ථූපවංශ, ආදී ලාංකේය වංශකතා මෙන්ම පූජාවලිය, අස්ගිරි තල්පත, ආදී මූලාශ්‍රයන්හි ද සාසන ජිනචක්ක නම් බුරුම පුස්කොළ පොත, ජිනකාලමාලි නමැති ඉතිහාස ග්‍රන්ථය, බුරුම සාසන වංශය ආදී බුරුම මූලාශ්‍රය ග්‍රන්ථ ද කල්‍යාණි ශිලා ලිපිය ආදී පුරාවිද්‍යා මූලාශ්‍රයන්හි ද තොරතුරු සඳහන් වන බව.

- ඓතිහාසික සාධකවලට අනුව දෙරට අතර බෞද්ධ සංස්කෘතික සම්බන්ධතා ප්‍රධාන වශයෙන් අංශ කීපයක් ඔස්සේ සිදු වීම.
    - ➢ භික්ෂු විනය පිරිහුණු අවස්ථාවලදී විනය කර්ම සහ ශාසන සංශෝධන සඳහා දෙරටෙහි භික්ෂූන් හුවමාරු කර ගැනීම
    - ➢ බෞද්ධ සංකේත, ග්‍රන්ථ හා සංස්කෘතිකාංග හුවමාරු කර ගැනීම
    - ➢ බුරුම භික්ෂූන්ට ශ්‍රී ලංකාව ක්ෂේම භූමියක් සේ ක්‍රියාත්මක වීම
    - ➢ වන්දනා මාන කිරීමේ බෞද්ධ පුදබිමක් ලෙස දෙරටම සම්භාවනාවට ලක් වීම

- ඓතිහාසික සාධක අනුව බුරුමය හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික සම්බන්ධතා ක්‍රි. පූ. තෙවැනි සියවසේ සිට (ධර්මාශෝක යුගයේ සිට) පැවතුණු බව.

- ක්‍රි. පූ. දෙවන සියවසෙහි දුටුගැමුණු රාජ්‍ය සමයේදී අනුරාධපුර මහා සෑ කර්මාන්තයේ මුල්ගල තැබීමේ උත්සවයට බුරුම භික්ෂූන් 9600ක් පමණ සහභාගී වූ බව.

- 11 වන සියවසේ ලක්දිව පාලකයා වූ පළමු විජයබාහු රාජ්‍ය සමයේ දී බුරුම පාලකයා වූ අනුරුද්ධ රජු ත්‍රිපිටකය හා පූජනීය වස්තූන් ලංකාවෙන් බුරුමයට ගෙනයාම, ලංකා සසුනෙහි උපසම්පදාව නැවත ප්‍රතිෂ්ඨාපනයට බුරුම භික්ෂූන් වැඩම වීම, හා දළදා අනුරුවක් හා වෙනත් පූජ්‍ය වස්තූන් ලංකාවෙන් බුරුමයට ලබා දීම හරහා දෙරට අතර සංස්කෘතික සම්බන්ධතා පැවති බව.

- අලෞංසිථු, නරථීන්ද, නරපතිසිථු (බුරුම) හා පළමු පරාක්‍රමබාහු (ලංකා) රාජ්‍ය යුගයන්හිදී දෙරටෙහි සංස්කෘතික සබඳතා තවදුරටත් ක්‍රියාත්මක වුණි. දෙරට අතර දේශපාලන ගැටුම් සමථකරණයට ලාංකීය භික්ෂූන් මැදිහත් වීම.

- උත්තරාජීව තෙරුන්ගේ හා ඡප්පට සාමණේරයන්ගේ ලංකාගමනය, ඡප්පට හිමියන්ගේ උපසම්පදාව, ඔහු වසර දහයක් අනුරාධපුර මහාවිහාරයෙහි ත්‍රිපිටකය හා අටුවා හැදෑරීම, ඡප්පට හිමි සමග බුරුමයට වැඩි මහාවිහාරීය භික්ෂූන් එහි සීහළසංඝ සම්ප්‍රදායක් ස්ථාපිත කිරීම.

- නරපතිසිථු රජුගේ ක්‍රියාකලාපය කෙරෙහි කළකිරීමට පත් පන්ථගු හිමියන් ක්‍රි. ව. 1167 දී ලංකාවට පැමිණි බවත් මෙම රජු භික්ෂූන්ට විවිධ හිංසා කරමින් උපැවිදි වීමට ද බලපෑම් කරන ලද බැවින් ඊට අකමැති වූ භික්ෂූන් ආරක්‍ෂාව පතා ලංකාවට පැමිණි බව.

- සාසනවංශයට අනුව බින්‍ය වූ පාලන සමයේදී (ක්‍රි. ව. 1353-1385) මේධංකර නම් බුරුම තෙර නමක් ලංකාවේ වනවාසී භික්ෂූන්ගෙන් උපසම්පදාව ලැබ ත්‍රිපිටකය හදාරා නැවත බුරුමයට වැඩම කිරීම.

- ක්‍රි.ව. 1234 දී ධර්මරාජ යන නමින් චාස්වා කුමරු රජවීමෙන් අනතුරුව ධර්ම අධ්‍යාපනය සඳහා දූත පිරිසක් බුරුමයෙන් ලංකාවට එවූ බව, ඔවුන් ධර්ම විනය හදාරා නැවත එරටට වැඩම කොට ආනන්ද නම් ලාංකික භික්ෂුවගේ මැදිහත් වීමෙන් හා රජුගේ අනුග්‍රාහකත්වයෙන් ශාසන ශෝධනයක් සිදු කරන ලද බව.

- බුරුම පාලක නරපතිහත (ක්‍රි. ව. 1254-1287) විසින් ඉදිකළ චෛත්‍යයට ශ්‍රී ලංකාවේ සිට සර්වඥ ධාතූන් වැඩම කර වූ බව.

- vi වන පැරකුම්බා රජු (ක්‍රි.ව. 1415-1468) ස්වකීය 45 වන රාජ වර්ෂයේදී සංඝ සංශෝධනයක් සිදු කොට කතිකාවතක් පිහිටුවීය. මෙකල බුරුමයෙන් භික්ෂූන් 6 නමක් පමණ ලක්දිව වනවාසී වනරතන මාහිමි, කල්‍යාණි ධම්මාචරිය මාහිමි, වනරතන සංඝරාජ මාහිමි ආදීන්ගේ මැදිහත්වීමෙන් කල්‍යාණි උදකුක්ඛේප සීමාවකදී උපසම්පදා විනය කර්මය සිදු කොට ශ්‍රී පාද හා සොළොස්මස්ථාන ආදී පුදබිම් වැඳ පුදා නැවත ගමන් කිරීම.

- ලක්දිව තුන් නිකායන්ට අයත් අමරපුර හා රාමඤ්ඤ යන නිකායද්වයම ඇරඹෙන්නේ බුරුම සම්ප්‍රදාය ගුරු කොට ගනිමිනි. 1803 දී අඹගහපිටියේ ඤාණවිමලතිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් අමරපුර නිකායත් අඹගහවත්තේ ඉන්දාසභවරඤාණ හිමියන්ගේ ප්‍රධානත්වයෙන් 1864 දී රාමඤ්ඤ නිකායත් පිහිටුවීම.

- දෙරට අතර තෑගි භාණ්ඩ හුවමාරුව ද සංස්කෘතික සම්බන්ධතා තහවුරු කිරීමට උපස්ථම්භක විය. බුරුමයෙන්, රන්, රිදී, මුතු, මැණික්, ආදියත් අලි ඇතුන් සහ විවිධ පූජා වස්තු ලක්දිවට ගෙනැවිත් පරිත්‍යාග කිරීමත් ශ්‍රී ලංකාවෙන් බහුල වශයෙන් මුතු, මැණික් හැරුණු විට බුදුදහමට සම්බන්ධ පූජාවස්තු හා ධර්ම ග්‍රන්ථයන් පරිත්‍යාග කිරීමත් සිදු විය.

- භාරතීය බුදුසමයේ පිරිහීමත් සමග බුරුම බෞද්ධයන්ගේත්, පාලකයන්ගේත් එසේම භික්ෂූන් වහන්සේගේත් වන්දනා බිම බවට ශ්‍රී ලංකාවේ පුදබිම් පත් විය. ශ්‍රී දළදාව, ශ්‍රී මහා බෝධිය, හා රත්නමාලි මහා සෑය ආදිය බුරුම සංස්කෘතිය විෂයයෙහි අති ප්‍රබල බලපෑමක් සිදු කළ බව.

**(ලකුණු 5)**

**08. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී යොදා ගත් විවිධ මුද්‍රා සනිදර්ශන ව හඳුන්වා දෙන්න.**

- බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී භාවිත ප්‍රමුඛ මුද්‍රා සයකි.
- **ධ්‍යාන මුද්‍රාව** - මහමෙව්නාවේ සමාධි පිළිමය, තොලුවිල සමාධි පිළිමය, ගල් විහාරයේ සමාධි පිළිමය, සමාධි මුද්‍රාවෙන් හෙවත් ධ්‍යාන මුද්‍රාවෙන් නිමවා තිබේ.
- **ධර්ම චක්‍ර මුද්‍රාව** - ඉන්දියාවේ සාරානාත් ප්‍රතිමාව ධර්ම චක්‍ර මුද්‍රාවෙන් නිමවා තිබේ.
- **අභය මුද්‍රාව** - ලක්දිව අවුකන, රැස්වෙහෙර, බුදුරුවගල හිටි පිළිමය අභය මුද්‍රාවෙනි.
- **විතර්ක මුද්‍රාව** - විතර්ක මුද්‍රාවෙන් යුක්ත බුද්ධ ප්‍රතිමාවක් බදුලු දිස්ත්‍රික්කයෙන් හමු ව දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.
- **භූමිස්පර්ශ මුද්‍රාව** - මෙම මුද්‍රාවෙන් යුක්ත බුදුපිළිම ලංකාවෙන් සොයාගැනීම අසීරුය. නමුත් ඉන්දුනීසියාවේ බෝරෝබුදූර්වල මෙම මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමා වේ.
- **වරද මුද්‍රාව** - මෙම මුද්‍රාවට අදාළ ප්‍රතිමා ද ලංකාවෙන් සොයා ගැනීම අසීරු වුව ද ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධ ප්‍රතිමාව මෙම මුද්‍රාවට අයත් බව විද්වතුන්ගේ මතයයි.

**(ලකුණු 5 )**

**08. (ii) භාරතීය සාංචි ස්තූපයට සාපේක්ෂව ශ්‍රී ලාංකේය ස්තූපවල පවත්නා ආකෘතිමය වෙනස්කම් පෙන්වා දෙන්න.**

- ශ්‍රී ලාංකේය ස්තූප භාරතීය සාංචි ස්තූපයේ ආකෘතිය පූර්වාදර්ශ කරගෙන තිබේ. එසේ වුවත් සාංචි ස්තූපයේ දක්නට නොමැති අංග ගණනාවක් ශ්‍රී ලාංකේය ස්තූපයේ දක ගත හැකිය.
- සාංචි ස්තූපයේ ප්‍රදක්ෂිණා පථයක් පැවති අතර ඒ වෙනුවට ලාංකේය ස්තූපවල තුන් මහල් පේසා වලලු දක්නට ඇත.
- සාංචි ස්තූපයේ හර්මිකා නමින් හැඳින්වූ ගරාදි වැටක් සහිත හතරැස් කොටුවක් විය. මුල් කාලීන ශ්‍රී ලාංකේය ස්තූපවල මෙම අංගය පැවතිය ද පසු කාලයේදී හතරැස් කොටුව වටා පැවති ගරාදි වැට ඉවත් ව ගිය අතර ඒ වෙනුවට ගරාදි වැට හුණු බදාමයෙන් එහි සලකුණු කර දැක්විය.
- හතරැස් කොටුව මත සාංචි ස්තූපයේ නොතිබුණු දේවතා කොටුව නමින් හැඳින් වූ නවාංගයක් ශ්‍රී ලාංකේය ස්තූපයට එක් විය.
- සාංචි ස්තූපයේ දක්නට ලැබුණු යූපය මුල්කාලීන ශ්‍රී ලාංකේය ස්තූපවල පැවතිය ද පසු කාලයේ දී එය කොත් කැරැල්ලක් බවට පරිවර්තනය විය.

- සාංචි ස්තූපයේ යූපය මත පැවති ඡත්‍රය ආදි කාලීන ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණවල පැවතිය ද පසු කාලයේදී ඡත්‍රාවලියක් බවට පත් වී අනතුරුව කොත බවට පත් විය.
- කොත මත චූඩා මාණික්‍යයක් සවි කිරීම ශ්‍රී ලාංකේය ස්තූපයේ දක්නට ඇත.
- ශ්‍රී ලාංකේය ස්තූප ගර්භයේ හැඩය අනුව ආකෘති ගණනාවකි.

ඝණ්ඨාකාර - අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය

ඝටාකාර - කතරගම කිරිවෙහෙර, සෝමාවතී ස්තූපය

බුබ්බුලාකාර - රුවන්මැලි සෑය, අභයගිරිය, ජේතවනය

ආමලකාකාර- මිහින්තලේ කණ්ඨක චෛතිය

පද්මාකාර - ලංකාවේ දැනට විද්‍යමාන නොවේ.

ධාන්‍යාකාර - කැළණි ස්තූපය

(ලකුණු 5)

**08.(iii) සඳකඩපහණ ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ අනන්‍යතාව තහවුරු කරන නිර්මාණයක් ලෙස ඇගයීමට ලක් කරන්න.**

- ඉන්දියාවේ පැවති පාටිකා නමින් හැඳින් වූ නිර්මාණය පූර්වාදර්ශ කර ගනිමින් ලක්දිව සඳකඩ පහණ නිර්මාණය විය.
- ලංකාවේ දී පාටිකා යන සංඥා නාමය අඩ්ඪචන්ද පාෂාණ, අඩ්ඪචන්ද පද ගණ්ඨිකා, අඩ සඳ පහණ, සඳකඩ පහණ යනාදි වශයෙන් වෙනස් වී තිබේ.
- නාගර්ජුන කොණ්ඩ, අජන්තා ලෙන් විහාර සංකීර්ණය වැනි ස්ථානවල ඇති සඳකඩ පහණ ලංකාවේ සඳකඩ පහණ මෙන් කලාත්මක නොවේ.
- ලංකාවේ බිසෝ මාළිගය අසල සඳකඩපහණ අනුරාධපුර යුගයේ උසස්ම නිර්මාණයක් බව.
- අනුරාධපුර යුගයට අයත් කලාත්මක සඳකඩ පහණ තුළ ගිනිදැල් මෝස්තරය ද ගවයා, ඇතා, අශ්වයා සහ සිංහයා යන සතුන් හතර දෙනා ද ලියවැල ද හංසාවලිය ද සිහින් ලිය වැලක් ද අර්ධ පද්මය ද යන මෝස්තර දක්නට ඇත.
- පොළොන්නරු යුගයේ දී හින්දු බලපෑම නිසා සඳකඩපහණින් ගවයා ඉවත් වී ඇති අතර අනෙකුත් සතුන් වෙන වෙන ම පේළිවල දක්වා තිබේ.
- සඳකඩ පහණේ සංකේත තුළ දාර්ශනික අර්ථයක් ගැබ්ව ඇතැයි එච්.සී. පී. බෙල්, සෙනරත් පරණවිතාන, බෙන්ජමින් රෝලන්ඩ්, විනී විතාරණ, චන්ද්‍රාවික්‍රම ගමගේ, ඩී.ටී. දේවේන්ද්‍ර වැනි විද්වතුන් ගණනාවක් අදහස් දක්වා තිබේ.
- සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩපහණින් භව චක්‍රය හා විමුක්තිය සංකේතවත් කෙරේ.

(ලකුණු 5)

**08.(iv) සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු පිටිවහල සාහිත්‍ය කෘති දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

- සිංහල සාහිත්‍ය පෝෂණයට වස්තු විෂය සැපයීමෙන් හා පාලි මූලාශ්‍රය පාදක කොට ගෙන පරිවර්තන හෝ අනුවාදාත්මක නිර්මාණ කිරීමට පෙළඹීම තුළින් උසස් නිර්මාණ බිහි විය.

- පරිවර්තන/අනුවර්තන

  බුත්සරණ - නව අරහාදි බුදුගුණ (අට්ඨකථා සහ පෙළ)
  දහම්සරණ - ධර්මරත්නයේ ගුණ (අට්ඨකථා සහ පෙළ)
  සඟසරණ - සංඝරත්නයේ ගුණ (අට්ඨකථා සහ පෙළ)
  අමාවතුර - පුරිසදම්මසාරථී බුදුගුණය (අට්ඨකථා සහ පෙළ)
  පූජාවලිය - අරහං බුදුගුණය (අට්ඨකථා සහ පෙළ)
  සද්ධර්මරත්නාවලිය - ධම්මපදට්ඨ කථාව
  මිලින්ද ප්‍රශ්නය - මිලින්ද පඤ්හය
  දම්පියා අටුවා ගැටපදය - ධම්මපදට්ඨ කථා ගැටපදය
  පන්සිය පනස් ජාතක පොත - ජාතකට්ඨ කථාව

- වස්තු විෂය

  මුව දෙව්දාවත - මඛාදේව ජාතකය
  සසදාවත - සස ජාතකය
  කව්සිළුමිණ - කුස ජාතකය
  බුදුගුණ අලංකාරය - විශාලාවේ තුන්බිය දුරුකිරීමේ කතා පුවත
  ගුත්තිල කාව්‍ය - ගුත්තිල ජාතකය

  වැනි කෘති දෙකක් පිළිබඳ ව ප්‍රමාණවත් විවරණයක් සැපයීම සෑහේ.

(ලකුණු 5)